# ශ්‍රී ලංකාවට නව යුගයක්

## සංක්ෂිප්ත ප්‍රතිපත්ති වේදිකා කෙටුම්පත

මාර්තු 2019

# පටුන


විධායක සාරාංශය 1

1. නීතිය මත පදනම් වූ පාලනය 3

1.1 ව්‍යවස්ථාදායක ප්‍රතිසංස්කරණ 3

1.2 පාර්ලිමේන්තු ක්‍රමය සහ රාජ්‍ය අංශය ප්‍රතිසංස්කරණය කිරීම 4

1.3 පළාත් සභා සහ පළාත් පාලන ආයතන 4

1.4 නීතිය හා සාමය ප්‍රතිෂ්ඨාපනය කිරීම 5

1.5 පුළුල්ව පැතිරි දූෂණ ක්‍රියා සම්බන්ධව කටයුතු කිරීම 5

2. බෙදාහදා ගන්නා ආර්ථිකයක් 5

2.2 21 වන සියවස සඳහා ප්‍රජාතන්ත්‍රවාදී මහජන හිමිකාරීත්වය 7

2.3 ආර්ථිකය ප්‍රජාතන්ත්‍රීකරණය කිරීම (සමාජ ආර්ථිකය) 7

2.4 විදේශීය/ දේශීය නව ආයෝජන ප්‍රතිපත්තිය 7

2.5 සදාචාරාත්මක වෙළෙඳ ප්‍රතිපත්තිය 8

2.6 බදුකරණය සහ විශ්ව ව්‍යාපී මූලික ආදායම 8

3. ශිෂ්ට සම්පන්න සමාජය 8

3.2 බහු සංස්කෘතිකත්වය 10

3.3 ආබාධිත පුද්ගලයන් රැකබලාගැනීම 10

3.4 ස්ත්‍රී පුරුෂ සමාජ භාවය මුඛ්‍යධාරාගත කිරීම 11

3.5 මාධ්‍ය සහ සන්නිවේදනය 11

4.3 ශ්‍රම සබඳතා 14

4.4 සංචාරක කර්මාන්තය සහ අදාළ කර්මාන්ත 14

5.1 සෞඛ්‍ය ක්‍රමය ප්‍රතිසංස්කරණය කිරීම 16

5.2 යහ පැවැත්ම, සතුට, ජීවගුණය සහ ආධ්‍යාත්මිකත්වය 16

5.3 කලාව සහ සංස්කෘතිය 17

5.4 ක්‍රීඩා 17

6. දැනුමෙන් සපිරි ජාතිය 18

6.3 කර්මාන්තය 4.0 යොදාගැනීම (ඩිජිටල් ආර්ථිකය) 20

7. ජාතික සම්පත් 20

7.2 ජල සුරක්ෂිතතාව 22

7.3 බලශක්තිය සුරැකීම 23

7.4 පාරිසරිකව තිරසර සංවර්ධනය 24

7.5 අපද්‍රව්‍ය කළමනාකරණය සහ සම්පත් ප්‍රතිසාධනය 24

7.6 ආපදා කළමනාකරණය සහ සමාජ ප්‍රත්‍යස්ථිතිය 24

8.1 ජාත්‍යන්තර සබඳතා හා විදේශ ප්‍රතිපත්තිය 27

8.2 අභ්‍යන්තර වෙළෙඳාම සහ හවුල්කාරීත්වය 27

8.3 කලාපීය සහයෝගීතාවය සහ ඒකාබද්ධතාව 27

8.4 ශ්‍රී ලාංකීය ඩයස්පෝරා ප්‍රජාව 27

9. කෘෂිකර්මය සහ පශු සම්පත් 28

9.2 ධීවර කර්මාන්තය හා සමුද්‍ර සම්පත් අංශය ප්‍රතිසංස්කරණය කිරීම 30

# විධායක සාරාංශය

අපේ ප්‍රතිපත්ති වේදිකාවේ පැහැදිලි අරමුණ වන්නේ සමානාත්මතාවාදී සමාජයක් ගොඩ නැඟීම කරා කටයුතු කරන ප්‍රගතිගාමී අනාගත දිශානතියක් සහිත ව්‍යාපාරයක් හැඩ ගැස්වීමයි. මෙම සමාජය සියලුම මට්ටම්වල සහභාගීත්වයෙන් යුත් ප්‍රජාතන්ත්‍රවාදයේත්, සමානාත්මතාවය, සමාජ සාධාරණත්වය සහ ආර්ථික නිදහසේත් තිර ප්‍රතිපත්ති මත පදනම් වෙනු ඇත. කිහිප දෙනෙකුගේ ලාභය උපරිමකරණය කිරීම වෙනුවට ,මුළුමහත් සමාජයටම අගයන් බෙදී යන පරමතාවක් සහිත සමාජයක් ලෙස සවිගැන්වෙනු ඇත.

එවැනි සමාජයක් සංවර්ධනය කළ හැක්කේ, සමාජය තුළ පවතින වර්තමාන සමාජ ආර්ථික සහ දේශපාලන තත්වයන් මත පදනම් වීමෙන් පමණි. වයස, ජාතිය, පංතිය හෝ ආගම නොතකා සියලු දෙනාට වැදගත් ජීවන තත්වයක් ගත කිරීමට අවස්ථාව සලසන ස්වයංක්‍රියනය සහ ඩිජිටල්කරණය වැනි උසස් තාක්ෂණයන්ගෙන් නූතන ලෝකය සවිමත්ය. ශ්‍රී ලංකාව 21 වන ශතවර්ෂයෙන් ඔබ්බට ගෙනයාම පිණිස, ඉතිහාසයේ මෙම සුවිශේෂී සන්ධිස්ථානය තුළ අපි ශ්‍රී ලංකාව තුළ ශීඝ්‍රයෙන් සිදුවෙන පරිහාණිය සඳහා නූතන විසඳුම් ගෙන එන්නේ එබැවිනි.

සමාජය තුළ පවතින බලය සහ ධනය බෙදී යාමේ අසමානතාවන්ට අභියෝග කිරීමෙන් තොරව සමාජ සාධාරණත්වය සහ ආර්ථික සමානාත්මතාව උදාකරගත නොහැකි බව අපි විශ්වාස කරන්නෙමු. අපට එවැනි අසමානාත්මතාවන් ජයගත හැක්කේ ජනතාව සවිබලගන්වා අවම ජීවන මට්ටම, යහ පැවැත්ම සහ අප සියලු දෙනාගේ උපරිම හැකියාවන් දක්වා සංවර්ධනය වීමට සමාන අවස්ථාවන් සහතික කිරීමෙන් පමණි.

මෙය සාක්ෂාත් කරගත හැක්කේ තමන් සම්බන්ධ තීරණයන් තමන්ටම ගැනීමට හැකි වෙන පරිදි ජනතාව සවිබලගැන්වීමෙනි. මෙය, ජාතියේ ආර්ථික, සමාජ සහ සංස්කෘතික ජීවිතය පාලනය කරන තීරණ ගැනීමේ ක්‍රියාවලිය සමග ප්‍රගතිකාරක ලෙස සහභාගි වීම සඳහා අපට අවස්ථාව සලසනු ඇත. එමගින්, නිදහස, එකමුතුකම, සාධාරණත්වය, ආර්ථික ආරක්ෂාව සහ සමානාත්මතාවය පවත්වාගැනීම තහවුරු කරගැනීමට හැකිය.

ඒ අනුව, මෙම ව්‍යාපාරය ගොඩනැගෙනු ඇත්තේ ජාතියේ සමාජ ආර්ථික සහ දේශපාලන ප්‍රගතියට සාමූහිකව දායක වන, සමාජ සාධාරණත්වය, සමානාත්මතාවය සහ සියලු දෙනා ඇතුළත් වීම මත පදනම් වූ මූලධර්මයන් මතයි. අපගේ සමාජයේ සෑම දෙනා සඳහා වන සාමකාමී සහජීවනයට හේතුභූත වන ඵලදායීතාව, නිර්මාණශීලීත්වය සහ ආචාර ධාර්මික ව්‍යවසායකත්වය තුළින් මෙම තත්වය උපදවා ගත හැකිය.

දේශපාලන කතිකාවතට සම්බන්ධ වීමේ සහ එය ක්‍රියාවට නැංවීමේ විකල්ප ක්‍රමයක් අපි පිරිනමන්නෙමු. සමාජ ඒකාබද්ධතාව සහ සමානාත්මතාවට බාධා කරන පවතින ගැටළුවලට පිළියම් සෙවීම සඳහා පහළ සිට ඉහළට මුළු මහත් සමාජයම සම්බන්ධ වන ක්‍රියාවලියක් ඉතා වැදගත් වන බව අපි විශ්වාස කරන්නෙමු. එමගින් නීතිය මත පදනම් වන, ස්වාධීන ජීවිත අගය කරන සහ සෑම දෙනාටම ගෞරවයෙන් සලකන සමාජයක් ගොඩනැගීමට අපට අවශ්‍යය. සමාජයේ ප්‍රගමනය උදෙසා කිසිදු තනි ජීවිතයක් පරිත්‍යාග කළ යුතු නැති බව අපි විශ්වාස කරන්නෙමු.

අපගේ ප්‍රතිපත්ති ප්‍රකාශය පහත දක්වා ඇති ආකාරයේ ප්‍රධානතම ක්ෂේත්‍රයන්ට නූතන විකල්ප එළඹුම් ඉදිරිපත් කරයි: දූෂණයට පිළියම් යෙදීම, ආර්ථික වර්ධනය අත්පත් කරගැනීම, ආර්ථිකය ප්‍රජාතාන්ත්‍රීයකරණය කිරීම, ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය, පළාත් පාලනය, රාජ්‍ය අංශයේ ප්‍රතිසංස්කරණ, සෞඛ්‍යය, අධ්‍යාපනය, ක්‍රීඩා, ප්‍රවාහන, කෘෂිකර්ම සහ බදුකරණ ක්ෂේත්‍රයන්ගේ ප්‍රතිසංස්කරණ, තිරසර සංචාරක කර්මාන්තය, ආයෝජන ප්‍රවර්ධනය, අනේවාසික ශ්‍රී ලාංකිකයන් සමග කටයුතු කිරීම, පාරිසරික තිරසර සංවර්ධනය, අපද්‍රව්‍ය කළමනාකරණය, කාර්මික සම්බන්ධතා, බහුසංස්කෘතිකත්වය, සමාජ ප්‍රතිපත්තිය, සදාචාරාත්මක වෙළෙඳාම, විද්‍යාව හා තාක්ෂණය (STEM), ස්ත්‍රී පුරුෂභාවය ප්‍රධාන ධාරාවට ගෙන ඒම, කලාව සහ සංස්කෘතිය, මාධ්‍ය සහ සන්නිවේදනය, සිව්වන කාර්මික විප්ලවයට හැඩගැසීම, ආපදා කළමනාකරණය සහ සමාජ ප්‍රත්‍යස්තිථිය, ජාත්‍යන්තර සබඳතා, කලාපීය සහයෝගීතාවය සහ ඒකාබද්ධබව, ජාත්‍යන්තර වෙළෙඳාම සහ හවුල්කාරීත්ව, ආහාර ආරක්ෂණය, ජල ආරක්ෂණය, බලශක්ති ආරක්ෂණය, අපද්‍රව්‍ය කළමනාකරණය සහ සදාචාරය, ආධ්‍යාත්මිකත්වය, සතුට සහ යහපැවැත්ම. සමාජ සාධාරණත්වය, ජනවාර්ගික එකමුතුකම සහ ආර්ථික සමානාත්මතාව මත ගොඩනැගුණු සාමූහික ක්‍රියාවන් තුළින් සමාජය සහ ස්ත්‍රී පුරුෂභාවය, ජනවාර්ගිකත්වය, කුලය, ආගම හෝ ලිංගික රුචිකත්වය නොසලකා පුද්ගලයා සවිබල ගැන්විය හැකි බවත් සක්‍රිය කළ හැකි බවත් අපි විශ්වාස කරන්නෙමු.

අපගේ මෙම පැහැදිලි ප්‍රතිපත්ති මූලාරම්භයන්, සලකා බැලීම, සාකච්ඡාව, සහභාගීත්වය සහ ආදානයන් සඳහා අපි ඔබ වෙත, ශ්‍රී ලංකාවේ ජනතාව වෙත ඉදිරිපත් කරන්නෙමු. මෙම ප්‍රගතිශීලී සහ සියල්ල ඇතුළත් වන ප්‍රතිපත්ති ප්‍රකාශය වටා සියලු ආකාරයන් සහ ආයතන භාවිතා කරමින් ජනතාව ඒකරාශී කිරීමේ කාර්යයට අපි ඇප කැප වී සිටින්නෙමු.

අප කළ යුතුම වෙනසක් වෙනුවෙන් අරගල කිරීමට ඒ වටා ජනතාව රැස් කිරීමේ කාර්යය පදනම් විය යුත්තේ කිසිසේත්ම මැතිවරණ දිනීම සඳහා වන කෙටි කාලීන කාර්යයක් මත නොව විකල්ප රජයක් සඳහා වන සැලකිය යුතු ප්‍රතිපත්තිමය ස්ථාවරයක් සහිතවයි. මෙම ප්‍රතිපත්තිමය ලේඛනය වෙත අප ප්‍රබල අවධානයක් යොමු කරන්නේ එබැවිනි. මෙම පරපුරට පමණක් නොව මතු පරපුරටද වැදගත් සමාජයක් දායාද කිරීමේ ලා අවශ්‍ය වන කාලයක් තිස්සේ ප්‍රමාද වෙමින් පැවති මෙම වැදගත් කාර්යය සඳහා ඔබට හැකි කිනම් හෝ ආකාරයකට සම්බන්ධ වන ලෙස අපි ඔබට ඇරයුම් කරන්නෙමු.

# 1. නීතිය මත පදනම් වූ පාලනය

## 1.1 ව්‍යවස්ථාදායක ප්‍රතිසංස්කරණ

විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කර පාර්ලිමේන්තු ක්‍රමයකට ගමන් කරන තෙක් ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කිරීම සම්පූර්ණ නොවේ- එහිදී විධායක බලතල අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලයට පැවරෙන අතර එය, නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදයේ උත්තරීතර ආයතනය වන පාර්ලිමේන්තුවට වග කියනු ලබයි. අගමැතිවරයාට තම ධුරයේ රැඳී සිටිය හැක්කේ පාර්ලිමේන්තුවේ විශ්වාසය පවතින තාක් කල් පමණි. අමාත්‍ය මණ්ඩල සාමාජිකයින් ගණන 25 කට නොවැඩි විය යුතු බවත් පාර්ලිමේන්තු ලේකම්වරු 25 ක උපරිමයක් සිටිය යුතු බවටත් ව්‍යවස්ථාව තුළ සඳහන් කළ යුතුය.

දෙවන මණ්ඩලයක් හෝ සෙනෙට් මණ්ඩලයක් ස්ථාපිත කිරීමට දිරිදෙනු ලැබේ. සෙනෙට් මණ්ඩලය සන්නිරීක්ෂණ සභාවක් ලෙස කටයුතු කළ යුතුය. කෙසේ වෙතත්, සෙනෙට් සභිකයින් එක් එක් පළාතෙන් පැමිණෙන නියෝජිතයින් 30 කින් සමන්විත විය යුතුය.

බහු සාමාජික සමානුපාතික මැතිවරණ ක්‍රමයක (MMP ක්‍රමය) සුදුසු බව විමර්ශනය කිරීම පිණිස අපගේ රජය පාර්ලිමේන්තු විමර්ශන කාරක සභාවකට (මැතිවරණ කරුණු කාරක සභාව) යොමු වෙනු ඇත.

සෑම පාර්ලිමේන්තු සභිකයෙක් හෝ අපේක්ෂකයෙක්/මැතිවරණ ව්‍යාපාර අධ්‍යක්ෂවරයෙක්, තමන් වෙත යම් නිශ්චිත ප්‍රමාණයකට වඩා වැඩියෙන් ලබාදෙන ප්‍රදානයන්, එම ප්‍රදායකයන්ගේ විස්තර සමග, එම ප්‍රදානය ලැබී සතියක් ඇතුළත මැතිවරණ කොමසාරිස් කාර්යාලය වෙත ප්‍රකාශයට පත් කළ යුතුය.

රජයේ එක් එක් මට්ටම් සඳහා, සුදුසු ලෙස වෙන් කරන ලද වගකීම් ප්‍රමාණයක් ලබාදෙන බවට අපගේ රජය වග කියනු ලබයි. අවසන් වශයෙන්, රජයේ සෑම මට්ටමකම වගකීම් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව තුළට ඇතුළත් විය යුතුය. ජාතික රජය සහ පළාත් සභාවලට එක්ව කටයුතු කිරීමට ඉඩ සලසමින් ශ්‍රී ලංකාවේ පාලන අස්ථිත්ව සභාව ලෙස තාවකාලිකව නම් කරන ලද ව්‍යුහයක් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව තුළට එක් කළ යුතුය.

---

## 1.2 පාර්ලිමේන්තු ක්‍රමය සහ රාජ්‍ය අංශය ප්‍රතිසංස්කරණය කිරීම

අපගේ ප්‍රතිපත්ති ගොඩනගනු ලබන පදනම් වන්නේ ප්‍රජාතන්ත්‍රවාදය, වගවීම සහ ජන සහභාගීත්වයයි. මෙහිදී සියලුම ශ්‍රී ලාංකිකයන්ට අදාළ වන ගැටළු විමර්ශනය කිරීම සඳහා ද්විපක්ෂ පාර්ලිමේන්තු කාරක සභා පැවතීම ඉතා වැදගත් වේ. මෙම කමිටු විසින් තම සොයාගැනීම් වාර්තා කළ යුතු අතර තම නිර්දේශයන් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය.

පාර්ලිමේන්තුව තුළ ස්වාධීන අයවැය කාර්යාලයක් (IBO) ස්ථාපිත කළ යුතුය. ස්වාධීන අයවැය කාර්යාලයේ භූමිකාවන් වන්නේ මැතිවරණයක් දක්වා දේශපාලන පක්ෂවල මූල්‍යයන බැඳීම් තක්සේරු කිරීම සහ ඔවුන් සිදු කරන ලද කාර්යයන් සහ නොකළ කාර්යයන් මහජනතාවට දැනගැනීම පිණිස පල කිරීමත්ය.

පළාත් සභා ආණ්ඩුකාරවරුන්ට ස්ථිර ධුර කාලයක් නියම කෙරෙන අතර අවසන් වසර දහය ඇතුළත දේශපාලන පක්ෂයකට සම්බන්ධව සිටි කිසිවෙක් ආණ්ඩුකාරවරයෙකු ලෙස පත් කරනු නොලැබේ.

ඇමතිවරු සහ අගමැති ඇතුළු සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසින් ලබාගන්න්නා වැටුප්, දීමනා සහ වෙනත් ප්‍රතිලාභයන් සමාලෝචනය කිරීම සඳහා පාර්ලිමේන්තු පාරිශ්‍රමික විනිශ්චය සභාවක් (PRT) පිහිටුවීම වැදගත් වේ.

සියලුම දෙපාර්තමේන්තු සහ රාජ්‍ය ආයතන සඳහා කෙරෙන සියලුම රාජ්‍ය අංශය බඳවාගැනීම් සම්බන්ධව කටයුතු කිරීමට රාජ්‍ය සේවා බඳවාගැනීම් කොමිෂන් සභාවක් ස්ථාපිත කෙරෙනු ඇත.

යහ පාලනය තහවුරු කිරීම පිණිස, පාර්ලිමේන්තු සංස්ථානික ව්‍යුහය (PCB) වැනි වෙනමම වූ පාර්ලිමේන්තු සේවා මාදිලියක් ස්ථාපිත කෙරෙනු ඇත. ඉහත ආයතනය හරහා තම මූල්‍යයන පාලක සහ තීරක ලෙස පාර්ලිමේන්තුවම කටයුතු කළ යුතු අතර එහි මුලසුන දරන නිලධරයා හරහා තම මුදල් බිල්පත් සම්බන්ධව කටයුතු කෙරෙනු ඇත.

අධිකරණ පත්වීම්, ඔවුන්ගේ ධුර කාලයන් සහ පාරිශ්‍රමිකයන් විධායක රජයෙන් ස්වාධීනව පාලනය කෙරෙනු ඇත.

---

## 1.3 පළාත් සභා සහ පළාත් පාලන ආයතන

එක් අතකට නාස්තිය අවම කරගැනීමටත් අනෙක් අතට පළාත් සභා පවත්වාගැනීම සාධාරණීකරණය කිරීම සඳහා වැඩි වගකීම් ලබාදීමටත් පළාත් සභාවල භූමිකාව සමාලෝචනය කිරීම ඉතා වැදගත් වේ.

එක් එක් පළාත් සභා තුළ වැඩ කරන භාෂාව ඒ ඒ සභාව විසින් තීරණය කරගත යුතුය.

ප්‍රාදේශීය අපරාධ සම්බන්ධව කටයුතු කරන ප්‍රාදේශීය පොලීසිය පළාත් සභාවේ වගකීමක් වන අතර ජාතික පොලීසිය, දේශ සීමා ආරක්ෂාව, මත්ද්‍රව්‍ය සම්බන්ධ ගැටළු, ජාත්‍යන්තර අපරාධ ක්‍රියාකාරකම් සහ ත්‍රස්තවාදය යනාදිය සම්බන්ධව කටයුතු කරනු ලැබේ.

ආයෝජන ප්‍රතිපත්ති රාමුව සහ ජාතික රජය විසින් සකසන ලද නීතිය තුළ පිහිටමින් ආයෝජන සඳහා විදේශ ආයතන ආකර්ෂණය කරගැනීමට අවශ්‍ය බලය පළාත් සභා වෙත ලබාදිය යුතුය.

ප්‍රාදේශීය සභාවල සහභාගීත්ව අයවැය මාදිලිය ක්‍රියාත්මක කිරීමේදී සභාවේ අයවැය වියදම් කළ යුතු ආකාරය තීරණය කිරීම සඳහා සභා බලප්‍රදේශය පුරා සිටින පුරවැසියන් ප්‍රසිද්ධ සංගම් තුළ එක් රැස් විය යුතුය.

---

## 1.4 නීතිය හා සාමය ප්‍රතිෂ්ඨාපනය කිරීම

ප්‍රගතිශීලී ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා නීතියේ ආධිපත්‍යය පිහිටුවීම ඉතා වැදගත් වේ. යෝජනා කෙරෙන මූලාරම්භයන් කීපයක් මෙසේය; පොලිස් කටයුතු වෙත දේශපාලනඥයන්ගේ මැදිහත්වීම සාපරාධී වරදක් බවට පත් කිරීම, පොලීසියේ දූෂණ ක්‍රියා විමර්ශනය කිරීම සඳහා ස්වාධීන පොලිස් අධීක්ෂණ මණ්ඩලයක් (Independent Police Monitor (IPM) ) පත් කිරීම සහ පොලීසිය වෙනුවෙන් අභිචෝදනා කටයුතු කිරීම සඳහා රාජ්‍ය අභිචෝදක කාර්යාලයක් (PPO) හා ස්වාධීන පුළුල් පදනම් දූෂණ විරෝධී කොමිෂන් සභාවක් (IBAC)පත් කිරීම.

---

## 1.5 පුළුල්ව පැතිරි දූෂණ ක්‍රියා සම්බන්ධව කටයුතු කිරීම

ශ්‍රී ලංකාව තුළ පුළුල්ව පැතිරී පවතින දූෂණ ක්‍රියාවන් සම්බන්ධව කටයුතු කිරීම ඉතා වැදගත් කර්තව්‍යයකි. මෙය සිදු කළ හැකි එකම මග වන්නේ ස්වාධීන පුළුල් පදනම් දූෂණ විරෝධී කොමිෂන් සභාවක් (IBAC)පත් කිරීමයි. මේ මොහොතේ ක්‍රියාත්මක වන කිසිදු දූෂණ විරෝධී ආයතනයකට වඩා ස්වාධීන පුළුල් පදනම් දූෂණ විරෝධී කොමිෂන් සභාවට (IBAC) බලය හිමි වෙනු ඇති අතර නිරන්තරව සිදුවන දූෂණ ක්‍රියාවලට එරෙහිව සටන් කරනු ඇත.

# 2. බෙදාහදා ගන්නා ආර්ථිකයක්

## 2.1. සාර්ව ආර්ථික සැලැස්ම - සමාජ වෙළෙඳපොළ

පෙර සඳහන් කළ ආකාරයට, අපගේ සෑම ප්‍රතිපත්ති ස්ථාවරයක්ම ගොඩනැගෙන්නේ “ලාභයට පෙර ජනතාව” යන අදහස පෙරදැරි කරගෙනයි. එමගින් අර්ථ ගැන්වෙන්නේ අපගේ ආර්ථික සැලසුම්කරණය යොමු වන්නේ “සාම්ප්‍රදායික ලාභ උපරිමකරණය” සඳහා නොව “හවුල් අගයන් උපරිමකරණය” හෙවත් සියලු දෙනා සඳහා සමාජමය යහ පැවැත්ම ප්‍රවර්ධනය කිරීම සඳහා බවයි.

එසේ කිරීම සඳහා අපි ඩිජිටල් තාක්ෂණ අනුවර්තනයන් මගින් බලගැන්වෙන සමාජ වෙළෙඳපොළ ආර්ථික ක්‍රමයක් හඳුන්වා දෙන්නෙමු. සමාජ වෙළෙඳපොළ ආර්ථිකය යනු නිදහස් වෙළෙඳපොළ පුද්ගලික ආයෝජක අංශය සමග සමාජ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගයන් එක් කරමින් වඩා සාධාරණ සහ ධර්මිෂ්ඨ සමාජයක් ස්ථාපිත කිරීම සඳහා අඩු වරප්‍රසාද සහිත අයගේ සුබසාධනය ඇති කිරීමයි.

සමාජ වෙළෙඳපොළ ආර්ථිකය, නිෂ්පාදනය, ශ්‍රම බලකාය හෝ අලෙවි සැලසුම් කිරීම සහ මග පෙන්වීමෙන් වළකින නමුත් වෙළෙඳපොළ අධ්‍යයනයන්ට නම්‍යශීලීව අනුවර්තනය වෙමින් විස්තීර්ණ ආර්ථික ප්‍රතිපත්තික් හරහා ආර්ථිකයට බලපෑම් කරයි. මෙවැනි ආකාරයේ ආර්ථික ප්‍රතිපත්තියක් සමස්ත ජනතාවගේ අවශ්‍යතාවන් සඳහා සේවය කරන සහ එමගින් අවසන් අරමුණ ඉෂ්ට කරන ආර්ථිකයක් නිර්මාණය කරනු ලබයි.

---

## 2.2 21 වන සියවස සඳහා ප්‍රජාතන්ත්‍රවාදී මහජන හිමිකාරීත්වය

මහජන හිමිකාරීත්වයේ පූර්ණත්වය ළඟා කරගත හැක්කේ ප්‍රජාතාන්ත්‍රික, වගවීමක් සහිත සියල්ල ඇතුළත්වන මාදිලීන් භාවිතා කිරීමෙන් පමණක් වන බව අපි විශ්වාස කරමු.

තීරණ මගින් බලපෑම් ලබන ජනතාව තීරණ ගැනීමේ ක්‍රියාවලියට වඩා සමීප කරවීම, බිල්පත් ගෙවන්නන් සහ සේවකයන්ට වඩා ප්‍රජාතාන්ත්‍රික හඬක් ලබාදීම මෙම එළඹුම මගින් සිදු කරනු ලැබේ. තම සේවා ස්ථානය ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳව තමන්ටද හඬක් ඇතිවිට සහ එහි සාර්ථකත්වය අභිමුව තමන්ටද එහි භූමිකාවක් ඇති විට ඵලදායීතාව ඉහළ යයි. පාරිභෝගිකයින් සහභාගි වෙන විට, ඔවුන් භාවිතා කරන සේවාවන් නිසි ලෙස ආයෝජනය කර ඇති බව සහ සෑම දෙනාගේම යහපත වෙනුවෙන් ක්‍රියාත්මක වන බව ඔවුන්ට තහවුරු කරගත හැකි වෙනු ඇත. තීරණ ගැනීම පාරදෘශ්‍ය වන අතර අප සියලු දෙනාගේ යහපත වෙනුවෙන් ගන්නා ලබන තීරණ වෙනුවෙන් තීරණ ගන්නන් වග වෙයි.

බලය සහ ධනය බෙදා හදා ගැනෙන ආර්ථිකයක් ගොඩනැගීමේ ලා අපි කටයුතු කරන්නෙමු. දේශපාලන බලය ක්‍රියාත්මක කිරීමේ පූර්ණ අවස්ථාව සාමාන්‍ය පුරවැසියන්ට ලබාදෙන ප්‍රමාණය අනුව දේශපාලන ආයතන මැන බලන්නාක් මෙන්, රාජ්‍ය හිමිකාරීත්වය විනිශ්චය කළ හැක්කේ එමගින් සාමාන්‍ය පුරවැසියන්ට ආර්ථික බලය ලබාදෙන්නේද යන්න මතයි. මහජන උපයෝගිතාවන් සහ ප්‍රවාහනය සැලසුම් කෙරෙනු ඇත්තේ, අපගේ ආර්ථිකයේ ප්‍රධාන සහයෝගී අගයන් සහ ප්‍රතිපත්ති පදනම් කරගෙනයි.

---

## 2.3 ආර්ථිකය ප්‍රජාතන්ත්‍රීකරණය කිරීම (සමාජ ආර්ථිකය)

අපි පුද්ගලික, රාජ්‍ය සහ ප්‍රජා ආයෝජන හිතෛෂී ව්‍යාපාරයක් වන්නෙමු. අපි පුද්ගලික අංශයද ඇතුළුව අප සමාජයේ සියලුම අංශයන් තුළ නිර්මාණශීලීත්වය, ව්‍යවසායකත්වය සහ නව්‍යෝත්පාදනය සඳහා දිරිදෙනු ලබන්නෙමු. අපි සමාජ ආර්ථික අංශය උද්යෝගිමත්ව ප්‍රවර්ධනය කරන්නෙමු. සමාජ ආර්ථිකය ආර්ථික ප්‍රජාතාන්ත්‍රවාදය පිළිබඳ සංකල්පයටද ඉතා හොඳින් ගැලපේ. සමුපකාර නම් පැරණි සංකල්පයේ වඩා නවීන සහ වඩා ප්‍රජාතාන්ත්‍රික අනුවාදය වනුයේ සේවක ස්වයං ප්‍රේරක ව්‍යාපාර (WSDE) යි. රජය විසින්, සේවක සමුපකාර අංශය ලෙස පොදුවේ හඳුන්වනු ලබන සහ භාණ්ඩ හා සේවා නිෂ්පාදනය සහ බෙදාහැරීම ප්‍රජාතාන්ත්‍රික කර ඇති WSDE අංශයේ මෙහෙයුම් කටයුතු ප්‍රවර්ධනය හා අධීක්ෂණය කිරීම සඳහා සේවක ස්වයං ප්‍රේරක ව්‍යාපාර අධිකාරිය පිහිටුවනු ඇත.

---

## 2.4 විදේශීය/ දේශීය නව ආයෝජන ප්‍රතිපත්තිය

පොදු සීමිත වගකීම් සමාගම් සංස්ථාපිත කිරීම, කළමනාකාරීත්වය සහ සේවකයන් විසින් සම කොටස් හිමිකාරීත්වය දැරීම, සංස්ථානික කළමනාකාරීත්වය තුළ බහු පාර්ශ්වීය සහභාගීත්වය සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල ප්‍රජා හිමිකාරීත්වය යනාදිය සඳහා දිරි දීමෙන් ප්‍රාග්ධන හිමිකාරීත්වය ප්‍රජාතාන්ත්‍රීයකරණය කිරීම වේගවත් කෙරෙනු ඇත.

රටේ ස්වාධිපත්‍යයට තර්ජනයක් නොකරන තාක් විදේශීය සහ දේශීය ආයෝජනයන් උද්යෝගයෙන් යුතුව පිළිගැනෙනු ඇත.

විදේශ සමාගම්වලට සහ නව දේශීය සමාගම්වලට සුදුසු පරිදි තාවකාලික බදු විරාම ලබාදීම වැනි දිරිගැන්වීම් සිදු කෙරෙනු ඇත.

මතු දිනෙක රජයේ සියලු මෝටර් රථ, ශ්‍රී ලංකාවේ මෝටර් රථ නිපදවන සමාගමකින් හෝ එකලස් අංගනයකින් මිලදීගත් ඒවා බවට පත්කිරීමට හැකිවන පරිදි අපි ප්‍රතිපත්ති සකස් කරන්නෙමු. වාහන නිෂ්පාදකයින්ට දේශීයව විදුලි වාහන නිෂ්පාදනය කිරීමට හෝ එකලස් කිරීමට දිරි ලබාදෙනු ඇත; එමෙන්ම, විදුලි වාහන මිලදී ගැනීමට වාහන හිමිකරුවන්ට සහ රියැදුරන්ට දීමනා ලබාදෙනු ඇත. මෙම උපාය මාර්ගය වෙනත් නිෂ්පාදන සඳහාද යොදාගත හැකිවෙනු ඇත.

---

## 2.5 සදාචාරාත්මක වෙළෙඳ ප්‍රතිපත්තිය

සියලුම ව්‍යාපාරයන් සඳහා ආචාර ධාර්මික වෙළෙඳාම් ප්‍රතිපත්තියක් අපි ප්‍රවර්ධනය කරන්නෙමු. නිෂ්පාදන සහ හෝ සංවිධාන ආචාර ධාර්මික වෙළෙඳ ප්‍රමිතීන් සහිත වන බවට සහතික කිරීම සඳහා සදාචාරාත්මක වෙළෙඳ නාමාංකන අධිකාරියක් පිහිටුවනු ලැබේ. සදාචාරාත්මක වෙළෙඳාම පිළිබඳ ජාත්‍යන්තර හොඳම පරිචයන් මත පදනම්ව, උදාහරණයක් ලෙස එක්සත් ජාතීන්ගේ 2030 න්‍යාය පත්‍රය තුළ තිරසර සංවර්ධනය සඳහා දක්වා ඇති තිරසර සංවර්ධන ඉලක්ක අනුගමනය කරමින් ව්‍යාපාර, වෘත්තීය සමිති සහ සිවිල් සමාජ සංවිධාන සමග එක්වී ආචාර ධාර්මික වෙළෙඳාම සහ සේවක අයිතීන් ප්‍රවර්ධනය සඳහා කටයුතු කරනු ඇත.

---

## 2.6 බදුකරණය සහ විශ්ව ව්‍යාපී මූලික ආදායම

හැකියාව ඇති සෑම විටම, අඩු ආදායමක් සහිත හෝ කිසිදු ආදායමක් රහිත අය සඳහා විශ්ව ව්‍යාපී මූලික ආදායමක් (UBI)ලබාදීමට රජය කටයුතු කළ යුතු බව අපි විශ්වාස කරමු.

තාක්ෂණයේ ඉදිරිගමන අනුව අපගේ දීර්ඝ කාලීන දැක්ම වනුයේ වැඩ රහිත ලෝකයකි! එය මේ මොහොතේ අවබෝධ කරගැනීමට නොහැකි තරම් න්‍යායාත්මක/පරමාදර්ශී විය හැකි වුවද ශ්‍රී ලංකාවද මේ වන විට ස්වයංකරණය සහ ඩිජිටල්කරණය යන දිශාවන්ට වේගයෙන් ගමන් කරමින් සිටිනු දක්නට ලැබේ. එය UBI අවශ්‍යතාවයක් බවට පත් කර ඇත.

එබැවින්, සෑම දෙනාටම බදු ගොනුවක් තිබීම ඉතා වැදගත් වේ. ගෙවිය යුතු බදු ප්‍රමාණය, රජයේ ආදායම් පදනම මත වරින් වර තීරණය කෙරෙනු ඇත. UBI, පුද්ගලයාගේ බදු ගොනු අංකයට සම්බන්ධ කෙරෙනු ඇත.

බදු ගෙවීම මග හැරීම බරපතල ලෙස සලකනු ලබනු අතර අක්‍රමිකතාවන් සහ බදු ප්‍රකාශ ප්‍රතිපත්තිකරණය සඳහා අවශ්‍ය සම්පත් සැපයෙනු ඇත. නිත්‍ය desk check පරීක්ෂණ රජය විසින් පුළුල් කරනු ඇති අතර අඛණ්ඩව පාඩු හිමිකම් ලබන්නන් හොඳින් අධීක්ෂණය කර වංචාකාරී මෙහෙයුම්කරුවන් නීතිය ඉදිරියට පමුණුවනු ඇත. සීමාවෙන් පහළ හිමිකම් ලබාගන්නන්ද ඇතුළුව සියලුම බදු ගෙවන්නන් සඳහා අහඹු පරීක්ෂණ සිදු කිරීමට අවශ්‍ය වේ.

# 3. ශිෂ්ට සම්පන්න සමාජය

## 3.1 සමාජ ප්‍රතිපත්තිය

සමාජ ප්‍රතිපත්තිය මගින් අපගේ සමාජය සංවිධානය වී ඇති ආකාරය, ප්‍රතිලාභ ලබන්නේ කවුරුන්ද සහ තමන්ගේ අවශ්‍යතා සඳහා සහය නොමැත්තේ කාහටද යන්න සම්බන්ධව අවධානය යොමු කෙරේ. ගැටළුව ලෙස නිර්වචනය කෙරෙන්නේ සමාජය විසින් රැකවරණය ලබාදීමට අසමත් වූ සහ නිතරම වෙනස් ලෙස සැලකීම්වලට බඳුන් වූවන්ය. එහිදී, අධ්‍යාපනය, සෞඛ්‍යාරක්ෂණය සහ සමාජ සංචලනය සඳහා වන අවස්ථාවන් සෑම විටම අවදානමට ලක්වේ. යහපත් සමාජ ප්‍රතිපත්තියක් යනු, පුද්ගලික සහ සමාජ ජීවිතයේ සියලුම ක්ෂේත්‍රයන් තුළ සියලු දෙනාට බලපානු ලබන සහ පුරවැසියන්ගේ යහ පැවැත්මට දායක වන එදිනෙදා ජීවිතය සඳහා වන සමාජ සැකසීමයි.

අපගේ සමාජ ප්‍රතිපත්තිය, සුබ සාධනය, සෞඛ්‍යාරක්ෂණය, අධ්‍යාපනය, ශ්‍රම වෙළෙඳපොළ සහ ළමා ආරක්ෂණය වැනි ප්‍රධාන සමාජ ගැටළු වෙත අවධානය යොමු කරයි. එමගින්, සෑම ශ්‍රී ලාංකිකයෙකුටම වැදගත් ජීවන තත්වයක් ලබාගත හැකිවන බවට සහතික වෙයි. අපගේ රට සමාජ යහ පැවැත්ම ප්‍රමුඛ කරන ජාතික රාජ්‍යයක් විය යුතු බවට අපි සලකන්නෙමු.

---

## 3.2 බහු සංස්කෘතිකත්වය

ශ්‍රී ලංකාව බහු ආගමික, බහු වාර්ගික සහ බහු සංස්කෘතික සමාජයක් බව අපි තරයේ විශ්වාස කරන්නෙමු.

ශ්‍රී ලාංකීය සමාජයේ විවිධත්වය වගකීමක් නොව සාධනීය ලෙස ප්‍රාග්ධනකරණය කළ හැකි වත්කමක් ලෙස අපි සලකන්නෙමු. ශ්‍රී ලංකාව ආර්ථිකමය, සමාජමය සහ සංස්කෘතිකමය වශයෙන් සංවර්ධනය වීමට සියලුම වෙනස් කණ්ඩායම් අතර සමාගමයක් සහ සහකම්පනයක් තිබිය යුතුය. එකිනෙකාගේ පුරුදු, සිතිවිලි සහ හැඟීම් සම්බන්ධව නොදැනුවත්ව එකිනෙකා වෙනත් ප්‍රදේශවලට අයත් හෝ වෙනත් ග්‍රහලෝකවල නිවැසියන් ලෙස සලකා කටයුතු කිරීම ශ්‍රී ලංකාවට විනාශය අත්කර දෙනු ඇත.

සියලුම ශ්‍රී ලාංකිකයන් හට ගරුත්වයෙන් සලකන සහ විවිධ ශ්‍රී ලාංකික කණ්ඩායම්වලට නිශ්චිත ගැටළු හඳුනාගනු ලබන නීතිය පදනම් සමාජයක් සඳහා අපි ව්‍යවස්ථාදායක රාමුවක් සකසන්නෙමු. සියලුම පුරවැසියන්ගේ ආගම ඇදහීමේ නිදහස සහ ආගමක් රහිතව සිටීමේ නිදහස අපි සහතික කරන්නෙමු.

බහුතර ජනතාවගේ ආගම බෞද්ධාගම ලෙස අපි හඳුනාගන්නෙමු. කෙසේ වෙතත්, රජයේ කටයුතු සම්පූර්ණ වශයෙන්ම කිසිදු ආගමික භාවිතයකින් ස්වාධීන වෙයි. ආගමික භාවිතාව ස්වාධීන පුද්ගලික කරුණක් බව අපි විශ්වාස කරන අතර කිසිදු ආගමික කටයුත්තක් ප්‍රසිද්ධ මහජන ජීවිතයට බාධාවක් නොවිය යුතුය.

---

## 3.3 ආබාධිත පුද්ගලයන් රැකබලාගැනීම

සමාජයක ශිෂ්ටබව මැනිය හැක්කේ එහි සිටින අඩු වරප්‍රසාද සහිත සාමාජිකයින්ට දයානුකම්පාව දක්වන ආකාරය සහ සහය ලබාදෙන ආකාරය අනුවයි.

2007 මාර්තු 30 වන දින ශ්‍රී ලංකාව, ආබාධිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතියට අත්සන් තබන ලද අතර 2016 පෙබරවාරි 08 වන දින, එනම් වසර 10 ක පමණ කාලයකට පසුව එය අපරානුමත කරන ලදී. මෙම සම්මුතිය අපරානුමත කිරීමෙන් ශ්‍රී ලංකාව එහි නියමයන් එනම්, ආබාධ සහිත පුද්ගලයන්ගේ සියලුම මිනිස් අයිතිවාසිකම් සහ මූලික නිදහස ප්‍රවර්ධනය කිරීම, ආරක්ෂා කිරීම සහ සමසේ භුක්ති විඳීම සහතික කිරීමට මෙන්ම ඔවුන්ගේ නෛසර්ගික ගරුත්වය ආරක්ෂා කිරීමට බැඳී සිටී.

ඒ අනුව, ආබාධිත පුද්ගලයන්ට වෙනස්කොට නොසැලකීම, ලිංගික හිංසනයට ලක් නොවීම සහ ආබාධයන් නොමැති පුද්ගලයන්ට රැකියාව සහ ප්‍රවාහනය වෙත පිවිසීමට ඇති හැකියාවම ලබාගැනීමට සහ ජීවිතය පූර්ණ ලෙස විඳීමට ඇති අයිතිය යනාදිය සඳහා සමාජය වග විය යුතු බව අර්ථ ගන්වන එක්සත් ජාතීන්ගේ සම්මුතිය පූර්ණ වශයෙන් අනුමත කරන්නෙමු. එබැවින්, ගරු කටයුතු සමාජයක් ලෙස ආබාධිත පුද්ගලයන්ගේ හිමිකම් ආරක්ෂා කිරීම සහ ඔවුන්ට සාධාරණ ලෙස සහ දයානුකම්පාවෙන් යුතුව සැලකීම නිවැරදි භාවිතාව වනවා පමණක් නොව සම්මුතිය අපරානුමත කිරීමෙන් පසුව එම සම්මුතියට අනුකූල පාලනයක් පවත්වාගැනීම ජාත්‍යන්තරව බැඳී සිටීමක්ද වෙයි. කෙසේ වෙතත්, ආබාධ සහිත පුද්ගලයන්ට සහය වීම පිණිස ශ්‍රී ලංකාව තුළ වන වැඩ පිළිවෙළ ඇත්තේ එක්සත් ජාතීන්ගේ සම්මුතියේ ප්‍රමිතීන්ට බොහෝ පිටුපසිනි.

'අබාධිත බව' යනු පුළුල් පරාසයක සෞඛ්‍ය තත්වයන් සහ දුබලතාවන් හඟවන පෘථුල යෙදුමකි. පුද්ගලයාට ප්‍රතිකාර කිරීම හෝ 'යථා තත්වයට පත් කිරීම සඳහා වන ආබාධිත බව සම්බන්ධ 'වෛද්‍ය මාදිලිය' ට වෙනස් ලෙස ආබාධිත බව සම්බන්ධ 'සමාජ මාදිලිය' තුළ භෞතික සහ සමාජමය පරිසරය තුළ, පවතින බාධාවන් සම්බන්ධව අවධානය යොමු කරන අතර එය සෞඛ්‍ය ප්‍රතිපත්තිය යටතේ ක්‍රියාත්මක වෙයි. සමාජ මාදිලිය තුළදී සිදු කෙරෙන්නේ, ආබාධිත පුද්ගලයන්ට ස්වාධීනව ජීවත් වීමට බාධා කරන ප්‍රජාව තුළ ඇති බාධක ඉවත් කිරීමයි.

අපගේ එළඹුම වන්නේ, ශ්‍රී ලංකාව තුළ ආබාධිත පුද්ගලයන්ට සහය ලබාදීමේ ක්‍රමය වැඩි දියුණු කර, ආබාධ සහිත පුද්ගලයන් සමාජ සහ ආර්ථික කාර්යයන්ට වැඩි වශයෙන් සම්බන්ධ කරගැනීමයි.

ආබාධිත බව සඳහා ලබාදෙන සහය සම්බන්ධ අපගේ මාදිලියය හරහා, වැඩි පුද්ගල කේන්ද්‍රීය එළඹුමක් තුළින් ආබාධිත පුද්ගලයන්ගේ 'සාධාරණ සහ ආවශ්‍යක' සහය අවශ්‍යතා සපුරාලීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කෙරෙන අතර එය පුද්ගලීකෘත සහ ස්වයං දිශානුගත මූල්‍යයනයක් (self-directed funding) ඔස්සේ සිදු කෙරෙනු ඇත.

මේ සඳහා, ආබාධිත බවේ සියලු පැතිකඩයන්, සේවා ස්ථානයේ වේවා, නිවසේ, පොදු ස්ථාන හෝ ප්‍රවාහනය යනාදියේ වේවා, විමර්ශනය කිරීම සඳහා බලය සහිත විමසුම් කොමිෂන් සභාවක් පත් කෙරෙනු ඇත. එය, නෛතික සුදුසුකම් සහිත, රාජ්‍ය සහ රාජ්‍ය නොවන අංශවල පලපුරුද්ද සහිත පුද්ගලයන්ගෙන් සහ පරිපාලන අත්දැකීම් සහිත ජ්‍යෙෂ්ඨ රාජ්‍ය සේවකයන්ගෙන් සමන්විත වෙනු ඇත. මෙම කොමිෂන් සභාව විසින් අදාළ ක්ෂේත්‍රය තුළ අත්දැකීම් සහිත දේශීය සහ ජාත්‍යන්තර ආයතන සහ පුද්ගලයන්ගෙන් උපදෙස් ලබා ගනු ඇත. මෙම අංශය හා සම්බන්ධව කටයුතු කරන, ආබාධිත පුද්ගලයන් රැක බලාගැනීමේ කාර්යයේ නියුතු පුද්ගලයන්ට මෙන්ම වඩා වැදගත් වශයෙන් ආබාධ සහිත පුද්ගලයන්ට, කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම් කළ හැකිය.

කොමිෂන් සභාවේ වාර්තාව ලැබී මාස හයක් ඇතුළත, රජය විසින් සහය ලබාදෙන්නේ කිනම් නිර්දේශයන්ටද යන්න සහ එසේ සහය නොදෙන නිර්දේශයන් ඇත්නම් ඒ මන්ද යන්න පැහැදිලිව ප්‍රකාශ කළ යුතුය. මෙහි අරමුණ වන්නේ ආබාධ සහිත පුද්ගලයන් ප්‍රධාන ධාරාවට ගෙන ඒම වන අතර එමගින් නෛතික හා නියාමන ක්ෂේත්‍රයන් තුළ ආබාධිත බව සඳහා වන එක්සත් ජාතීන්ගේ සම්මුතිය ක්‍රියාත්මක කිරීමට වන බැඳීම පිළිබිඹු කෙරෙනු ඇත.

---

## 3.4 ස්ත්‍රී පුරුෂ සමාජ භාවය මුඛ්‍යධාරාගත කිරීම

ජීව විද්‍යාත්මකව ලිංගිකත්වය අතර වන වෙනස්කම් මත ගොඩනැගුණු සමාජ සංස්කෘතික ගොඩනැගුමක් ලෙස අපි ස්ත්‍රී පුරුෂ සමාජ භාවය දකිමු. එබැවින්,ස්ත්‍රී පුරුෂ සමාජ භාවය යනු කිසියම් ස්වභාවික හෝ සහජ දෙයක් නොව සමාජය විසින් ගොඩනගන ලද්දකි. තිළිණ, සම්පත් සහ අවස්ථාවන් වෙත \පිවිසුම් අවස්ථාවන් (නෛතික සමානාත්මතාව) ලබාදීමේදී ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව ප්‍රධානත්වයේ ලා සලකන අතර ස්ත්‍රී පුරුෂ සමානත්මතාවයේ ස්ථිර ප්‍රතිඵල (සත්‍ය සමානාත්මතාව) ලබාගැනීමට කටයුතු කෙරේ.

එහි ප්‍රතිඵලයක් ලෙස, අපගේ එළඹුම, රැකියා, අධ්‍යාපන සහ සෞඛ්‍ය අභිවර්ධනයන් සඳහා පවතින පාලන රාමුව ඔස්සේ වැඩි හෝ සමාන අවස්ථාවන් ඉල්ලා සිටීමට සීමා වන ලිබරල් ස්ත්‍රීවාදී ව්‍යාපාරයන්ගෙන් වෙනස් වෙනු ඇත

කාන්තාවන්ට සහ ළමුන්ට එරෙහිව එල්ලවන ප්‍රචණ්ඩත්වයෙන් තොර ශ්‍රී ලංකාවක් බිහි කිරීමට අපි ඇප කැප වන්නෙමු. එවැනි ප්‍රචණ්ඩ ක්‍රියාවන් හරහා පුද්ගලයන්ට, ප්‍රජාවට, ආයතනවලට සහ සමාජයට දැඩි ලෙස හානි සිදුවෙන බව අපි පිළිගන්නෙමු. මෙම ගැටළුවට ප්‍රධාන වශයෙන් හේතු වන්නේ ස්ත්‍රී පුරුෂ අසමානතාව නිසා බවත් එයට විසඳුම ඇත්තේ එතුළම බවත් අපි විශ්වාස කරන්නෙමු. කාන්තාවන්ගේ ආර්ථික, සමාජමය සහ දේශපාලන අයිතීන් ආරක්ෂා කෙරෙන සහ කාන්තාවන් සහ පුරුෂයින් අතර බලය සහ සම්පත් සමානව බෙදී යන පුළුල් සංස්කෘතික සහ ක්‍රමානුකූල වෙනසක් මෙම ප්‍රචණ්ඩත්වය සැලකිය යුතු ලෙස අඩු කරනු ඇත.

මෙය, 1995 සැප්තැම්බර් මසදී බීජිං නුවර පැවති ලෝක සමුළුවේ අභියෝජනාවන් ක්‍රියාත්මක කිරීම සමග මෙන්ම සාකල්‍ය ජාතික ප්‍රතිපත්ති විශ්ලේෂණය, සම්පාදනය, ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය සමග ස්ත්‍රී පුරුෂ සමාජ භාවය මුඛ්‍යධාරාගත කිරීම සමග සමපාත වෙයි.

---

## 3.5 මාධ්‍ය සහ සන්නිවේදනය

ස්වාධීන වූ ශ්‍රී ලංකා මාධ්‍ය අධිකාරියක් (SLMA) පිහිටුවීම වැදගත් බව අපි දකින්නෙමු. මෙම ආයතනයේ වගකීම වන්නේ, ගුවන්විදුලි සහ රූපවාහිනී විකාශයන්, මුද්‍රිත සහ වෙනත් ඉලෙක්ට්‍රොනික මාධ්‍ය බිය හෝ පක්ෂපාතීත්වයකින් තොරව නියාමන රාමුව තුළ ක්‍රියාත්මක වෙමින් සියලුම ශ්‍රී ලාංකිකයන්ට සමබර සේවාවක් සපයන බව තහවුරු කිරීමයි. මහජනතාව විසින් මහජනතාව වෙනුවෙන් මූල්‍යයනය කර පාලනය කරනු ලබන ජනතා විකාශන සේවාවක් පැවතිය යුතු බව අපි විශ්වාස කරන්නෙමු. එය වාණිජමය හෝ රාජ්‍ය හිමිකාරීත්වය රහිත, දේශපාලන මැදිහත්වීම්වලින් සහ වාණිජ බලපෑම්වලින් තොර සේවයක් වෙනු ඇත.

# 4. අනාගතවාදී කර්මාන්ත සහ යටිතලපහසුකම්

## 4.1 මහජන ප්‍රවාහනය සහ මාර්ග ජාලය

ප්‍රාදේශීය බස් රථ, කුලී වාහන සහ කුලී මොටර් රථ සේවාවන් පළාත් සභාව යටතට ගෙන ආ යුතුය. නගරාන්තර බස් සහ දුම්රිය සේවාවන් ජාතික රජය යටතේ ක්‍රියාත්මක වේ. නගරාන්තර බස් සේවාවන්, දුම්රිය සේවය, විනෝදාස්වාදය සඳහා නොවන යාත්‍රා සේවාවන් සහ පළාත් සභාවේ වගකීමට අයත් නොවන වෙනත් භූ ප්‍රවාහන ක්‍රමයන් මෙහෙයවීම සඳහා ජාතික ප්‍රවාහන අධිකාරියක් පිහිටුවනු ලැබේ.

රැකියාව සඳහා දුර ප්‍රදේශවල සිට නගරයට පැමිණිය හැකිවන පරිද්දෙන්, වේගවත් දුම්රිය ව්‍යාපෘති ඇතුළු ප්‍රධාන යටිතල පහසුකම් සැපයීම ජාතික රජය විසින් සිදු කළ යුතුය.

රාජ්‍ය අංශයේ බස් රථ, පුද්ගලික මෙහෙයුම්කරුවන් සමගම ධාවනය කළ හැකි අතර සෑම පළාතක්ම මෙම සේවාවන් අධීක්ෂණය කිරීම සඳහා ඔවුන්ගේම වූ මහජන ප්‍රවාහන අධිකාරියක් පිහිටුවාගත යුතුය.

දුම්රිය ස්ථානවල සිට සහ ඒ වෙත පෝෂක බස් සේවාවන් ක්‍රියාත්මක කිරීම අනිවාර්ය වේ. කුලී රථ, Uber, ත්‍රී රෝද රථ, ගාස්තු බෙදාගැනීමේ පහසුකම් සහ කුලී මෝටර් රථවලට අදාළ මෙහෙයුම් කටයුතු එක් එක් පළාත් සභාවේ ප්‍රවාහන අධිකාරිය විසින් නියාමනක් කළ යුතුය. වේදිකා (හවුල්) සමුපකාර (Platform (sharing) Co-operatives) භාවිතා කළ හැක්කේ මෙහිදීය.

කොළඹ සහ කොළඹ නගරෝපාන්තයන්ගේ ප්‍රවාහන තදබදය තුරන් කිරීම සඳහා ජාතික ප්‍රවාහන අධිකාරිය අධ්‍යයනයක් සිදු කළ යුතුය. මෙම අධ්‍යයනය මගින් අහස් දුම්රිය, ට්‍රෑම් රථ, වැඩි දියුණු කළ දුම්රිය සහ බස් රථ සේවා වැනි පොදු ප්‍රවාහන විකල්ප ගණනාවක් සම්බන්ධව සහ කොළඹ නගරාභ්‍යන්තරයට වාහන ගලා ඒමේ සීමාවන් පැනවීම සම්බන්ධව සලකා බලනු ඇත. ප්‍රායෝගික සෑම අවස්ථාවකදීම රජයේ කාර්යාල කොළඹ නගරයෙන් පිටතට ගෙන යාමට සැලසුම් කිරීම ඉතා සුදුසු වේ. මාර්ග වාහන තදබදය අවම කිරීමට මෙම සලකා බැලීම් ඇතුළත් වෙනු ඇත.

---

## 4.2 සුහුරු නගර වැඩසටහන

පුරවැසියන්ගේ යහ පැවැත්ම සහ ආර්ථික වර්ධනය සඳහා නගර යනු ඉතා වැදගත් මධ්‍යස්ථාන වේ. තදබදය, ප්‍රාදේශීයව පවතින අසමාන සංවර්ධනය, දූෂණය සහ නාගරිකව වාසය කරන්නන් බොහොමයක් අර්ථාන්විත ආර්ථික කටයුතුවල නොයෙදීම වැනි හේතු නිසා වර්තමානයේ අප රටේ නගර පීඩනයට පත්ව ඇත. සැලසුම් සහගත නොවන පැරණි ආර්ථික වර්ධන මාර්ග දැන් සුදුසු නොවේ. මෙම අවුල් සහගත තත්වයෙන් මිදීම පිණිස නව ක්‍රමයන් අවශ්‍ය වන අතර සාම්ප්‍රදායික ආර්ථික කටයුතු නමැති බාධකයන් ඉවත් කිරීමට නව තාක්ෂණික සංවර්ධනයන් යොදා ගත යුතුව ඇත. වඩා තිරසර, හරිතමය සහ යහපත් අනාගතයක් රටට ගෙන ඒම සඳහා රජයේ හා පුද්ගලික අංශයේ සියලුම මට්ටම් මෙන්ම ජනතාවද සම්බන්ධීකරණය කෙරෙන අනුකලිත උපාය මාර්ගික එළඹුමක් අපට අවශ්‍ය වේ.

අපගේ අරමුණ වන්නේ නාගරික ප්‍රතිසංස්කරණයන් වැඩි දියුණු කරන වඩා යහපත් සහ සුහුරු පහසුකම් සහ ප්‍රවාහනයන් වෙත ජනතාවට පිවිසිය හැකි නාගරික පරිසරයක් නිර්මාණය කිරීමයි. මේ සඳහා, තිරසර, ජීවත්විය හැකි නිවාස සහ කර්මාන්ත මෙන්ම උසස් තත්වයේ පොදු ස්ථාන ඇතුළු යටිතල පහසුකම් සංවර්ධනය කිරීම අවශ්‍ය වේ.

මේ සඳහා වන ප්‍රධාන එළඹුම වනු ඇත්තේ සංවර්ධනය වෙමින් පවතින සහ වෙනත් ස්ථානවල ක්‍රියාත්මක කර අත්හදා බලා ඇති, ඉහළ අධ්‍යාපනයකින් යුතු හා නව අවස්ථාවන්ගෙන් ප්‍රතිලාභ ලබාගැනීමේ හැකියාව ඇති ශ්‍රම බලකායක් අවශ්‍ය වන නව සුහුරු තාක්ෂණයන් යොදා ගැනීමයි.

මේ සඳහා පහසුකම් සපයාගැනීමට අපි ශ්‍රී ලංකා යටිතල පහසුකම් අධිකාරිය (IASL) ස්ථාපිත කරන්නෙමු. මෙම ආයතනය, සමස්තයක් ලෙස මුළු රටම සඳහා අනුකලිත යටිතල පහසුකම් සැලසුමක් නිර්මාණය කරමින් සුහුරු නගර වෙත සංක්‍රමණය වීම කළමනාකරණය කිරීමේ ප්‍රධාන සංවිධානය වෙනු ඇත. ඔවුන්ගේ නිර්දේශ මත පදනම්ව,සියලුම පාර්ශ්වකරුවන්ගේ මැදිහත්වීමෙන් සුහුරු නගර සැලසුමක් සංවර්ධනය කෙරෙනු ඇත. මෙහිදී පාර්ශ්වකරුවන් ලෙස හැඳින්වෙන්නේ රජය, ජනතාව සහ කර්මාන්තයි.

ඉහත ප්‍රතිපත්ති අනුව, ශ්‍රී ලංකා යටිතල පහසුකම් අධිකාරිය නාගරික මධ්‍යස්ථාන ඇගයීම, සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සිදු කරනු ඇත. එම නාගරික මධ්‍යස්ථානවල:

1. තිරසර බව, උසස් ජීවන තත්වය සහ කාර්යක්ෂමභාවය ප්‍රධාන ප්‍රතිඵල වෙනු ඇති අතර එහිදී පුනර්ජනනීය බලශක්ති නවෝත්පාදනයන්ගේ පූර්ණ වාසි ලබාගනු ඇත;
2. ඉහළ ජන ගනත්වයක් පවතින ස්ථානවල ප්‍රජා උද්‍යාන, හරිත පවුරු සහ වහල, මහජන කලා නිමැවුම් සහ ක්‍රීඩා පිටි නිර්මාණය කෙරෙනු ඇත;
3. බයිසිකල් ධාවන මාර්ග සහ ඇවිදීමේ මං තීරු ඇතුළුව මනා ලෙස සැලසුම් කරන ලද ප්‍රවාහන ජාලයක් සමග පරිසර හිතෛෂී ප්‍රවාහන මාර්ග සංවර්ධනය කෙරෙනු ඇත;
4. නගරවලට ගමන් කිරීමේ කාලය අඩු කිරීමෙන් තදබදය සහිත ප්‍රවාහන කාලවල් ඉවත් කෙරෙනු ඇති අතර ප්‍රාදේශීය කලාප නගරවල වෙළෙඳපොළ සමග සම්බන්ධ කෙරෙනු ඇත;

5. සංචාරක කර්මාන්තය සහ සෞඛ්‍ය හා වයස්ගත රැකවරණ ප්‍රදේශ වැනි සේවාභිමුඛ කලාපවල නව රැකියා අවස්ථාවන් සංවර්ධනය කෙරෙනු ඇත;
6. වැඩි අවස්ථාවන් නිර්මාණය කිරීමෙන් විදෙස්ගත ශ්‍රමිකයන් නැවත රට වෙත ගෙන්වා ගනු ඇත;
7. සේවා ස්ථාන අසළ නිවාස සහ ප්‍රවාහන මධ්‍යස්ථාන වැඩි දියුණු කෙරෙනු ඇති අතර එමගින් වැඩි ජනතාවකට තම රැකියා ස්ථානය අසළම ජීවත් වීමට හැකියාව ලැබෙනු ඇත;
8. නගරවැසියන් මුහුණ දෙන ගැටළුවලට පිළියම් සෙවීමට සුහුරු තාක්ෂණය යොදාගනු ඇත.

---

## 4.3 ශ්‍රම සබඳතා

අපගේ ශ්‍රම සබඳතා ප්‍රතිපත්තිය මගින් සේවා ස්ථාන සැකසුම් සහ ඒ ආශ්‍රිත සේවා නියුක්ති කරුණු සම්බන්ධව විධිවිධාන සලසයි. මෙම ප්‍රතිපත්තිය, රැකියා ස්ථානයක, වෘත්තීය සමිතිවලට ගොනු වූ හෝ නොවූ සෑම රැකියාවකම සියලුම සේවා නියුක්ති සම්බන්ධතාවලට අදාළ වෙනු ඇත. පවතින කර්මාන්ත සබඳතා සම්බන්ධව විමසා බැලීම සඳහා අපි පාර්ලිමේන්තු විමර්ශන කාරක සභාවක් පත් කරන්නෙමු. ආරම්භයේදී, කර්මාන්ත සබඳතා විනිශ්චය සභාවේ බලතලවල සුදුසු බව සහ ස්වාධීනත්වය විමර්ශනය කිරීම සඳහා උපදෙස් සපයනු ඇත. සියලුම සේවකයන්ට ආරක්ෂණ යාන්ත්‍රණයක්, අවමයට වැඩි වැටුපක් සහ කර්මාන්ත මතභේද නිරාකරණය කිරීම සඳහා අධිකරණමය නොවන විනිශ්චය බලයක් සහිත ස්වාධීන කර්මාන්ත සබඳතා කොමිෂන් සභාවක් මගින් තීරණය කරන ලද කොන්දේසි මාලාවක් තිබිය යුතු බවට අපි විශ්වාස කරන්නෙමු.

---

## 4.4 සංචාරක කර්මාන්තය සහ අදාළ කර්මාන්ත

මෙම වැදගත් කර්මාන්තය වැඩි දියුණු කිරීමට, රජය විසින් විවිධ ආකාරයේ සංචාරක ව්‍යාපාරයන් දෙස අවධානය යොමු කළ යුතුය; ස්වභාවධර්මය, ක්‍රීඩාව, විනෝදාස්වාදය සහ සාමාන්‍ය සංචාරක කරමාන්තය යනාදිය.

දකුණු ආසියානු සංචාරකයන්ට පහසුවෙන් පිවිසිය හැකි සහ වාරි මාර්ගය සඳහා භාවිතා නොකෙරෙන බිමක, විනෝදාස්වාද පහසුකම් සහිතව විශාල සංචාරක සහ ක්‍රීඩා සංකීර්ණයක් ඉදිකිරීමේ ශක්‍යතාවය පිළිබඳව විස්තරාත්මක අධ්‍යයනයක් කිරීම වටනේය.

මෙය හුදු සංචාරක සහ ක්‍රීඩා සංකීර්ණයක් පමණක් නොව පවුල් සඳහාද විවිධ ආකාරයේ ක්‍රියාකාරකම් සහිත විනෝදාස්වාදය සපයන ප්‍රදේශයක් විය යුතුය.

සිංගප්පූරුවේ කලාපීය මධ්‍ය ගුවන්තොටුපල හා සමානවම ශ්‍රී ලංකාවේ ගුවන් තොටුපොළ සංවර්ධනය කළ හැකිය. ක්‍රීඩා සංකීර්ණ අදහස ක්‍රියාත්මක කළ හැකිවන්නේ නම්, එම සංකීර්ණය පිහිටා ඇති ප්‍රදේශයේ අභ්‍යන්තර ගුවන්තොටුපොළක්ද පිහිටුවිය හැකිය. මුහුදට මුහුණලා මෙම සංකීර්ණය සංවර්ධනය කළ හැකි නම්, කෲස් යාත්‍රා පහසුකම්ද ඉදි කළ හැකිය. මෙමගින් කොළඹ ගුවන්තොටුපොළට සිදුවෙන පැමිණීම් වැඩි වෙනු ඇත.

සංචාරකයින්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ප්‍රමාණවත් ආරක්ෂක ක්‍රියාමාර්ගයන්ද ගත යුතුය.

# 5. සෞඛ්‍යය සහ ජාතියේ යහපැවැත්ම

## 5.1 සෞඛ්‍ය ක්‍රමය ප්‍රතිසංස්කරණය කිරීම

පුද්ගලයන්ගේ ධනවත්කම මත නොව පුද්ගල අවශ්‍යතා මත පදනම් වූ සෞඛ්‍ය ක්‍රමයක් සම්බන්ධව අපි විශ්වාසය තබන්නෙමු. අපගේ ප්‍රතිපත්තිමය ස්ථාවරය වන්නේ මෙයයි.

සියයට 2 ක වෛද්‍යාරක්ෂණ බද්ද: සියලුම දෙනා තම ආදායමෙන් සියයට දෙකක් වැනි සුළු ප්‍රමාණයක් ජාතික සෞඛ්‍ය අරමුදලට දායක කෙරෙන සර්වව්‍යාපී වෛද්‍ය ක්‍රමයක් හරහා මෙය සාක්ෂාත් කරගත හැකිය.

අවයව පරිත්‍යාගය : කිසියම් අයෙක් අවයව ප්‍රදානය නොකිරීමට තෝරන්නේ නම් මිස සියලු දෙනාම අවයව ප්‍රදායකයෙකු ලෙස නීතිගත කෙරේ.

3D මුද්‍රණ තාක්ෂණය තුළින් අවයව නිර්මාණය කිරීම සම්බන්ධව පර්යේෂණ සිදු කිරීමට විශාල ආයෝජනයක් සිදු කෙරෙනු ඇත.

වේදනා නාශක උවටැන් (පවතින්නේ නම්) ව්‍යාප්ත කිරීම සහ සසහාය මරණය සඳහා විධිවිධාන සැපයීම සම්බන්ධව පිරික්සා බැලිය යුතුය.

ශ්‍රී ලංකාව තුළ ගබ්සා නීති සම්බන්ධව විස්තරාත්මක අධ්‍යයනයක් සිදු කෙරෙනු ඇති අතර සුදුසු සහ අවශ්‍ය නිතිමය වෙනස්කම් සිදු කෙරෙනු ඇත.

වරප්‍රසාද ලත් කිහිප දෙනෙකුට පමණක් නොව සියලු දෙනාගේම යහපත සඳහා සෞඛ්‍ය පද්ධතියට සිදු කළ යුතු වෙනස්කම් සම්බන්ධ ප්‍රතිපත්තිමය ස්ථාවරය ක්‍රියාත්මක කිරීමට පුද්ගලික රෝහල්වල භූමිකාව, වෛද්‍ය රක්ෂණය, ප්‍රජා සෞඛ්‍ය මධ්‍යස්ථාන සහ මහජන දෛනික සැත්කම් ස්ථාන, දන්ත සෞඛ්‍යය, මානසික සෞඛ්‍යය, අක්ෂි වෛද්‍ය විද්‍යාව යනාදිය පිළිබඳව විස්තරාත්මක අධ්‍යයනයන් සිදු කරන ලෙසට සෞඛ්‍යය පිළිබඳ පාර්ලිමේන්තු විමර්ශන කාරක සභාවට උපදෙස් ලබාදෙනු ඇත.

---

## 5.2 යහ පැවැත්ම, සතුට, ජීවගුණය සහ ආධ්‍යාත්මිකත්වය

යහ පැවැත්ම

යහපැවත්ම සෞඛ්‍යයටත්, සෞඛ්‍යය යහපැවැත්මටත් දායක වන බවට වන කරුණ අපි පිළිගන්නා අතර එම යහ පැවත්ම යන සාධකය විෂය මූලික සහ මනෝ මූලික මූලාංගයන්ගේ එකතුවක් වන බව හඳුනාගනිමු. එනිසා, යහපැවැත්ම සංවර්ධනය පිළිබඳ ජාතික අධිකාරිය (NWDA) ස්ථාපිත කෙරෙනු ඇති අතර, ජාතික යහ පැවැත්ම සහ සතුට මැනීම සඳහා භාවිතා කළ හැකි සංයුක්තයන්, එය මැනිය හැකි දර්ශකයන් සහ ප්‍රායෝගිකව එම දත්ත එක් රැස් කරගත හැකි ආකාරය පිළිබඳව තීරණය කිරීම සඳහා එළඹුමක් තෝරාගැනීමට, අදාළ ක්ෂේත්‍රය තුළ විශේෂඥයින් හරහා තාක්ෂණික අධ්‍යයනයන් සිදු කිරීමද එහි කාර්යයන්ට ඇතුළත් වෙයි. මෙය තාක්ෂණිකව සංකීර්ණ, දේශපාලනිකව සංවේදී ක්‍රියාවලියක් වෙනු ඇත.

සතුට

සතුට මගින් යමෙකු තම ජීවිතය පූර්ණ ලෙස විඳීම, මනුෂ්‍යයෙකු ලෙස පුද්ගලික සංවර්ධනය ළඟා කරගැනීම සහ තම පැවැත්මේ අර්ථාන්විතභාවය පිළිබිඹු වේ. මෙහිදී ද්‍රව්‍යාත්මක සංවර්ධනය මෙන්ම ප්‍රජාව, සංස්කෘතිය, සබඳතා, ආධ්‍යාත්මිකත්වය, මානසික යහපැවැත්ම සහ පරිසරය සමග වන එකමුතුකමද වැදගත් වේ. පුද්ගලයෙකුගේ සතුට මනෝමූලික මෙන්ම විෂයමූලික කරුණුවලින් සමන්විතය. මෙහි එක් සංරචකයක් වන්නේ යහපත් සෞඛ්‍යය, අධ්‍යාපනය, ජීවන තත්වය, පාරිසරික විවිධත්වය, ප්‍රත්‍යාස්තිථිය, යහ පාලනය, සංස්කෘතික විවිධත්වය සහ විවේක කාලය යන අංගවලින් සමන්විත මානසික යහපැවැත්මයි.

ජීවගුණය

ජීවන වියදම පිළිබඳ ආතතිය, අස්ථාවරත්වය, මානව අයිතිවාසිකම් කඩවීම, කම්පනය, මරණය, විනාශය සහ යුද්ධය මෙන්ම සාමය සඳහා වන අතිමහත් ආශාව යනාදියෙන් යම් ජනතාවක් පීඩාවට පත්ව සිටින්නේ නම්, එහි ජීවගුණය අඩුවෙයි. සමාජයක සිය දිවි නසාගැනීමේ ප්‍රමාණයද එය මුහුණ දී ඇති ආතති මට්ටම පෙන්නුම් කරයි. එය පසුපස ඇති හේතු අතරට මානසික සෞඛ්‍ය ගැටළු, ඇබ්බැහි වීම්, සබඳතා ගැටළු හා යම් යම් සිද්ධීන්ට අදාළව ඇතිවන සමාජමය කැලැල් යනාදිය ඇතුළත් වේ.

අඩු ජීව ගුණය හේතුවෙන් ජනතාව, තමන්ට සහ තම පවුලට වඩා යහපත් අවස්ථාවන් සොයා රටින් පිටවීම සිදුවේ. එබැවින් සමස්තයක් ලෙස ජනතාවට මුහුණ දීමට සිදුවෙන සමාජමය සහ පුද්ගලමය ආතති මට්ටම, ජීවගුණය පවත්වාගැනීම කෙරෙහි අභියෝගයන් එල්ල කරයි ජීවගුණය වැඩි දියුණු කරගැනීමට, ජනතාවගේ සහභාගීත්වය, අන්තර්සම්බන්ධතාව, අදහස් විමසීම සහ සන්නිවේදනය ඉතා වැදගත් වන අතර රජයේ ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටීන්ට සම්බන්ධ කරගත යුතුය.

ආධ්‍යාත්මිකත්වය

ආධ්‍යාත්මිකත්වය යනු ජීවිතයේ අරුත සහ අරමුණ සොයාගැනීමට අදාළ අභ්‍යන්තරික ක්‍රියාවලිය ලෙස සැලකෙන පුළුල් සංකල්පයකි. එය, තමන් සහ අනෙක් අය සමග, පරිසරය සමග නැතහොත් මිනිසා විශ්වාස කරන පරිදි තම ස්වීයත්වයට වඩා වැඩි බලයක් සමග වන සම්බන්ධතාව වේ. එමෙන්ම සෞඛ්‍යය, අසනීප, රෝග විනිශ්චයන්, සුවපත් වීම් සහ අභිමිවීම් සම්බන්ධව මිනිසාගේ තේරුම් ගැනීම කෙරෙහිද

ආධ්‍යාත්මිකත්වය බලපායි. එබැවින්, සෞඛ්‍ය සහ සෞඛ්‍යාරක්ෂණ ප්‍රතිපත්ති සඳහා ජනතාවකගේ අධ්‍යාත්මිකත්වය/ ආගමික ලැදි බව සොයාගැනීම වැදගත් වේ.

අප විශ්වාස කරන පරිදි, රජයක යම් නිශ්චිත ආකාරයන් සහ රාජ්‍ය ප්‍රතිපත්තිවල ප්‍රතිඵල සමග යහපැවැත්ම සමීප සම්බන්ධතාවක් දක්වයි. සතුට යනු යමක අවසානයක් නොව, අදාළ සමාජ සහ ආර්ථික ඉලක්කයන් සාක්ෂාත් කරගැනීමේ ප්‍රතිඵලයකි. රාජ්‍ය ප්‍රතිපත්ති, ජනතාවගේ සමස්ත යහපැවැත්මට බලපෑම් කරන බවත් එමගින් බොහොමයක් පුද්ගලයන් උඩත් ලෙස සංචල වන බවත් (upwardly mobile) අපි විශ්වාස කරන්නෙමු.

ප්‍රායෝගික අරුතකින් බලන කල, පාසල් අධ්‍යාපනය සම්බන්ධ සුදුසු ප්‍රතිපත්ති අනුගමනය කර තරුණ ජනතාව ජීවිතයේ අභියෝගයන් සඳහා සූදානම් කිරීමෙන්, සෞඛ්‍ය ප්‍රතිපත්ති සැකසීමේදී රෝගීන්ගේ අත්දැකීම් සහ යහපැවැත්ම සලකා බැලීමෙන් සහ ප්‍රජාව තුළ එකිනෙකා අතර වඩා යහපත් සම්බන්ධතා තහවුරු කරන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමෙන් ජනතාවගේ යහපැවැත්ම වැඩි කිරීම සඳහා මූලාරම්භය සැපයිය හැකිය.

---

## 5.3 කලාව සහ සංස්කෘතිය

ශ්‍රී ලංකාවේ අනන්‍යතාවයට, කලාව, සංස්කෘතිය, උරුමය සහ නිර්මාණශීලීත්වය මූලික වන අතරම ජාතික ආර්ථිකයේ සාර්ථකත්වයටද ඉවහල් වේ. කලාව සහ සංස්කෘතිය අපේ ප්‍රජාවන්ගේ සෞභාග්‍යය, වාසය කළ හැකි බව හා සංතෘප්තිය වෙත ඍජු ලෙස දායක වෙමින් අපේ සමාජයේ සංස්කෘතික ජෛව ශක්තිය සෙසු ලෝකයා වෙත ප්‍රවර්ධනය කරයි.

අපගේ දැක්ම වන්නේ නිර්මාණශීලී සහ අන්තර්ග්‍රාහී ජාතියක් නිර්මාණය කිරීමයි. ශ්‍රී ලංකාව නිවහන කරගෙන සිටින සියලුම ප්‍රජාවන්ගේ කලාවන්, සංස්කෘතීන් සහ උරුමයන් සංවර්ධනය කිරීම, ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා අපි පියවර ගන්නෙමු. අපගේ සාරවත් සහ විවිධත්වයෙන් යුතු සංස්කෘතික උරුමයන් පිළිගැනීම, ගරු කිරීම, අර්ථ නිරූපණය කිරීම හා වර්ධනය කිරීම සඳහා දායක වන නිර්මාණශීලී මූලාරම්භයන් සංවර්ධනය කර ඒවාට සහය ලබාදීමට අපි අදහස් කරන්නෙමු.

අපගේ රටේ සුවිශේෂී සහ සාරවත් පෞරාණික කලාවන් සහ සංස්කෘතික උරුමය සංරක්ෂණය කිරීමට පියවර ගන්නා අතරම සෙසු ලෝකයේ කලා හා සංස්කෘතික උරුමයන්ගේ විශේෂිත ලක්ෂණද හඳුන්වා දෙන්නෙමු. අපගේ සංස්කෘතික විවිධත්වය පිළිගෙන එයට ගෞරව කොට ඒවා සැමරිය යුතුව ඇත. මෙය දේශීයව පමණක් නොව අපගේ ජාතික දේශසීමාවලින් පිටතද අතීත රිදවීම් සුවපත් කර බහු සංස්කෘතික සමාජ නිර්මිතය ශක්තිමත් කිරීමට දායක වෙනු ඇත. එකිනෙකට වෙනස්, එහෙත් එක හා සමාන වටිනාකමින් යුත් කලාත්මක ප්‍රකාශන, ජනතාවගේ අවබෝධය, දරාගැනීම ඇති කිරීමට සහ විවිධ මතයන් සහ එළඹුම් සඳහා ගෞරවය දැක්වීමට දිරිගන්වනු ලබයි.

---

## 5.4 ක්‍රීඩා

අප ක්‍රීඩාව දකිනුයේ ක්‍රීඩාවේ ජීවගුණය සම්බන්ධ දෘෂ්ටි කෝණයෙන් පමණක් නොවේ. එමගින් ජාත්‍යන්තර ප්‍රජාව සමග සම්බන්ධතා ඇති කරගනිමින් රටට ආර්ථිමය වශයෙන් ප්‍රතිලාභ ගෙන එන මාවතක්ද ලෙසය. බලයට පත් වූ විට අපි ක්‍රීඩා කටයුතු ආයෝජනය හා වෙළෙඳ සබඳතා සඳහා පෙර ගමන් කරුවකු ලෙස යොදා ගන්නා බව ප්‍රකාශ කිරීම අතිශයෝක්තියක් නොවේ.

ක්‍රීඩාව යනු ගෝලීය ව්‍යාපාරයක් වන හෙයින්, ක්‍රීඩාව හරහා ප්‍රබල දූෂණ විරෝධී පණිවුඩයක් යැවීම, ලොව පුරා ක්‍රීඩාව තුළ සිදුවන දූෂණයට එරෙහිව කරන සටනට උපකාරයක් වෙනු ඇත. මානව අයිතිවාසිකම්, කම්කරු අයිතිවාසිකම්, පරිසරය සහ දූෂණ විරෝධී අවශ්‍යතාවන්ට ගරු කරමින් සියලුම ක්‍රීඩා ආයතන සහ ඉසව් සංවිධානය කළ යුතුය.

උදාහරණයක් ලෙස සියලුම ක්‍රීඩා සංවිධානවලට, තම එදිනෙදා කටයුතුවලදී පාරදෘශ්‍යභාවය, වගවීම, අවංකබව සහ ප්‍රජාතන්ත්‍රවාදය අනුගමනය කිරීමට සහ අභ්‍යන්තර අනුකූලතා ක්‍රමවේදයක් පවත්වාගැනීමට විස්තිවිධාන සැලසීමෙන් අපි ප්‍රබල දූෂණ විරෝධී ක්‍රියාමාර්ග ගන්නෙමු.

# 6. දැනුමෙන් සපිරි ජාතිය

## 6.1 අධ්‍යාපන ක්‍රමය ප්‍රතිසංස්කරණය කිරීම

අධ්‍යාපනය යනු අනාගතය වෙත වන ආයෝජනයක් ලෙස අප සලකන අතර වරප්‍රසාද ලත් කිහිප දෙනෙකුට පමණක් නොව සියලුම ශ්‍රී ලාංකිකයින්ට ඒ වෙත පිවිසුම තිබිය යුතු බව අපි සලකමු. අධ්‍යාපනයේ අගය සම්බන්ධව සමාජමය සහ දේශපාලන එකඟතාවක් පැවතීමෙන් ශ්‍රී ලංකා අධ්‍යාපනය ක්‍රමයේ ව්‍යුහය සහ ප්‍රධාන ලක්ෂණයන්ට ස්ථාවරත්වයක් ලැබෙනු ඇත.

පාලන සැකසුම්

අධ්‍යාපන ක්‍රමයේ පාලනය ජාතික සහ පළාත් අධිකාරීන් අතර බෙදී යා යුතුය. ජාතික රජය අධ්‍යාපන ප්‍රමුඛතාවන් නිර්වචනය කළ යුතු අතර පළාත් සභා පාසල් සහ දිවා සුරැකුම් මධ්‍යස්ථාන නඩත්තු කර සහය ලබාදිය යුතුය. එමෙන්ම අධ්‍යාපනය සංවිධානය කිරීම, මූල්‍යයනය කිරීම, විෂය මාලාවන් සැකසීම සහ පුද්ගලයන් බඳවාගැනීම සිදු කිරීමේ සැලකිය යුතු වගකීමක් පළාත් සභාවන්ට පැවරේ.

බල ප්‍රදේශමය වගකීම්

විශ්ව විද්‍යාල සහ තාක්ෂණික පාසල් ඇතුළු තෘතියික අධ්‍යාපන අංශය ජාතික රජයේ වගකීම යටතට පැමිණේ.

ගුරුවර ගැටළු

ඉගැන්වීම සමාජය තුළ වටිනා වෘත්තියක් බවට පත් කළ යුතුය. ගුරුවරුන්, පර්යේෂණ සහ භාවිත පදනම් අධ්‍යයනයන් ඇතුළත් වන අධ්‍යාපනය සම්බන්ධ ශාස්ත්‍රපති උපාධි යක් සහිත විශ්වසනීය වෘත්තිකයන් විය යුතුය.

ප්‍රාථමික සහ ද්විතියික අධ්‍යාපන විෂය මාලාවන් සම්බන්ධව විමර්ශනය කිරීමට අපි අධ්‍යාපනය පිළිබඳ විමර්ශන කාරක සභාවට උපදෙස් ලබාදෙන්නෙමු. කාරක සභාවේ නිර්දේශ මත රජය කටයුතු කරනු ඇත.

සැලසුම

සෑම වසර හතරකටම වරක් පාර්ලිමේන්තුව විසින් අධ්‍යාපන ප්‍රතිපත්ති ප්‍රමුඛතා සංක්ෂිපතව දැක්වීමට ජාතික අධ්‍යාපන සහ පර්යේෂණ සංවර්ධන සැලසුමක් සකස් කළ යුතුය.

ජාතික ප්‍රමිතීන්

විද්වතුන්, විදුහල්පතිවරුන්, ගුරුවරුන් සහ වෙනත් අධ්‍යාපන කාර්ය මණ්ඩලවල ප්‍රවීණතාවය සහ විශ්වාසය මත ප්‍රාථමික, ද්විතීයික සහ තෘතියික අධ්‍යාපන ආයතන වෙත වැඩි අවධානයක් දැක්විය යුතුය.

ළදරු පාසල්

සෑම දරුවෙකුටම ප්‍රාථමික අධ්‍යාපනය ලැබීම අනිවාර්ය කෙරෙනු ඇත.

සමානාත්තමතාව සහ පහළ ප්‍රගති මට්ටම් වැළැක්වීම ගැන අවධානය යොමු කරමින් (වයස අවුරුදු පහේ සිට පහළොව දක්වා) වසර දහයක පරිපූර්ණ මූලික අධ්‍යාපනය ලැබීම අනිවාර්ය කරනු ඇත. අපගේ අධ්‍යාපන ප්‍රතිපත්තිය අනුව, සාමාන්‍ය සහ වෘත්තීය අධ්‍යාපනය හා පුහුණු වීමේ විකල්පයන් අතර, තෘතියික අධ්‍යාපනයක් ලබා ගන්නට මඟ පාදන අන්දමට ඉහළ ද්විතීයික මට්ටමේදී නම්‍යශීලී වෙයි.

පුද්ගලික අංශය

තෘතියික අධ්‍යාපනය සඳහා වන් පුද්ගලික ආයතන ශ්‍රී ලංකා අධ්‍යාපන ක්‍රමයේම කොටසක් වන බැවින්, රාජ්‍ය සහ පුද්ගලික අංශයේ තෘතියික අධ්‍යාපන ආයතනවල ඇතුළත් වීමේ අවශ්‍යතා මට්ටම මෙන්ම අවසන් ඇගයීම් මට්ටමේ ක්‍රියාවලීන්ද ප්‍රමිතිගත කිරීම වැදගත් වේ.

---

## 6.2 සිව්වන කාර්මික විප්ලවය සහ විද්‍යාව, තාක්ෂණය, ඉංජිනේරු විද්‍යාව හා ගණිතය (STEM)

අපි සිටින්නේ තාක්ෂණය සහ කර්මාන්ත ශීඝ්‍ර වශයෙන් වෙනස් වීමට ලක්වන සිව්වන කාර්මික විප්ලවය (කර්මාන්ත 4.0) මධ්‍යයේය. එහෙත් අපගේ අධ්‍යාපන සහ පුහුනු ක්‍රමයන් අවශ්‍ය හැකියාවන් සංවර්ධනය කිරීමට, විශේෂයෙන් තොරතුරු පදනම් සහ තාක්ෂණික පරිසරයන් තුළ වෙළෙඳපොළ ඉල්ලුම්වලට සරිලන හැකියාවන් සැපිරීමට ප්‍රමාණවත් ලෙස සැලසුම් කර නැත. කර්මාන්ත 4.0 සඳහා සූදානම් ශ්‍රම බලකායක් සඳහා විද්‍යාව, තාක්ෂණය, ඉංජිනේරු විද්‍යාව සහ ගණිත (STEM) හැකියාවන් අවශ්‍ය වේ. එනිසා, කර්මාන්ත මට්ටමේ හැකියාවන් සමග අධ්‍යාපන විෂය මාලාවන් පෙලගැන්නුම් කරමින් අනාගතයට අවශ්‍ය වන STEM හැකියාවන් සංවර්ධනය කළ යුතුය.

STEM අධ්‍යාපනය පිළිබඳ විස්තීර්ණ සමාලෝචනයක් සිදු කිරීමට STEM අධ්‍යාපන සමාලෝචන කාරක සභාවක් (STEMERC) පත් කෙරෙනු ඇති අතර එමගින් ප්‍රාථමික, ද්විතියික සහ තෘතියික අධ්‍යාපනය තුළ හඳුනාගත හැකි ඌනතා සම්බන්ධව කටයුතු කර STEM අධ්‍යාපනය ඉහළම ප්‍රමිතියට ගෙන ඒමට පියවර ගනු ඇත. මහජන අදහස් විමසීම තුළින් STEMERC කමිටුව, පුළුල් ප්‍රජාවද ඇතුළුව අදාළ ක්ෂේත්‍රවල විශේෂඥයින්ගේ නිපුණතාවන් ලබාගනු ඇත. ඉදිරිය පිළිබඳව දැක්මක් සහිතව බැලූ විට, කර්මාන්ත තුළ මෙන්ම පුහුණුව සහ අධ්‍යාපනය සපයන්නන් අතර කර්මාන්තය 4.0 තාක්ෂණයන් පිළිබඳ හා කර්මාන්ත පදනම පරිවර්තනය කිරීම සඳහා වන සේවා පදනම් එළඹුම් පිළිබඳ දැනුවත්භාවය ඇති කිරීම ඉතා වැදගත් වෙයි.

## 6.3 කර්මාන්තය 4.0 යොදාගැනීම (ඩිජිටල් ආර්ථිකය)

සිව්වන කාර්මික විප්ලවය (කර්මාන්තය 4.0 ලෙසද හැඳින්වේ) යනු වර්තමානයේ ලොව පුරා සිදුවන ඩිජිටල් විප්ලවයයි. මයික්‍රොචිප්, PLC, පුද්ගලික පරිගණකය, අන්තර්ජාලය, ජංගම දුරකථනය සහ මෑතකාලීන සමාජ මාධ්‍ය සොයාගැනීමත් සමග 1970 පමණ සිට සිදුවෙමින් පවතින තුන්වන කාර්මික විප්ලවයේ (කර්මාන්තය 3.0) තොරතුරු සන්නිවේදන තාක්ෂණයන්ට වඩා මෙය බෙහෙවින් වෙනස් වේ.

අප විශ්වාස කරන ආකාරයට, කර්මාන්තය 4.0 නිසි ලෙස කළමනාකරණය කළහොත්, එයට ශ්‍රී ලංකාව වැනි රටවලට සාම්ප්‍රදායික සංවර්ධන උපාය මාර්ගයන් අනුගමනය කිරීමෙන් තොරව සංවර්ධන අභියෝගයන් අභිබවා පිම් පැනීමට උපකාර විය හැකිය. කර්මාන්තය 4.0 මගින්, වැඩි දියුණු කළ ඵලදායිතාවේ, වැඩි දියුණු කළ නිෂ්පාදන හැකියාවේ, කුඩා සාමාජිකයෙකුව සිටිමින්ම ජාත්‍යන්තර තරගකාරීත්වයේ, දේශීය ව්‍යාප්ත නිෂ්පාදනයේ, වඩා හොඳ සේවා තත්වයන් සහ තිරසර බව ඇතුළු තවත් බොහෝ දේවල ප්‍රතිලාභ ගෙන එනු ඇත. එමෙන්ම,කර්මාන්තය 4.0, වර්තමාන ආර්ථික සැකසුම්, වැඩි දත්ත ආරක්ෂණ අභියෝග, සාම්ප්‍රදායික රැකියාවල් අහිමිවීම්, හැකියා පරතර, ආයතනික සැකසුම් ඌනතාවන් සහ ඩිජිටල් යටිතල පහසුකම් සහ අහිතකර 'සමාජ ප්‍රතිචාර' වැනි නව අභියෝග සහ අවදානම්වලට අප නිරාවරණය කරනු ඇත.

එබැවින් ශ්‍රී ලංකාව කර්මාන්තය 4.0 ට ප්‍රක්‍රිය ලෙස යොදාගත යුතු බව අපි විශ්වාස කරන්නෙමු. එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, ජපානය, චීනය, ඉන්දියාව, කොරියාව සහ යුරෝපා සංගමය වැනි පුරෝගාමී රටවල හොඳම පරිචයන් අධ්‍යයනය කරමින් අපි කර්මාන්තය 4.0 යොදාගැනීම සඳහා ජාතික උපාය මාර්ගයක් සම්පාදනය කරන්නෙමු. කර්මාන්තය 4.0 සඳහා පාරිසරික පද්ධතියක් සංවර්ධනය කිරීමේ ප්‍රතිපත්ති සැකසුමේදී පුද්ගලික අංශය, විද්වතුන් සහ පර්යේෂණ ආයතන, ප්‍රජාවන්, සිවිල් සමාජය සහ වෙනත් හවුල්කරුවන් ඇතුළු බහු පාර්ශ්වකරුවන් සම්බන්ධ කරගන්නෙමු. අපගේ සමාජ වෙළෙඳපොළ චින්තනයත් සමග අපි විවෘත සංවර්ධන මූලාරම්භයන් සඳහා හා නව සමාජ ව්‍යාපාර මාදිලීන් සඳහා දිරිදෙන අතර හැකියා සංවර්ධනය සහ වෙනස්වීම් කළමනාකරණය තුළ ආයෝජනය කරන්නෙමු. අපගේ කර්මාන්තය 4.0 ජාතික උපාය මාර්ගයේ ප්‍රධාන සංරචකය වන්නේ සියලුම පාර්ශ්ව සහ ජාත්‍යන්තර හවුල්කාරීත්වය අතර නවෝත්පාදක සහයෝගී යාන්ත්‍රණයක් ගොඩනැගීමයි.

සුළුතරය සඳහා ලාභ උපරිම කරනවා වෙනුවට සමස්ත සමාජයේ හවුල් වටිනාකම්වලට ප්‍රමුඛත්වය දීමේ අපගේ පුළුල් සැලැස්ම තුළ අධ්‍යයනයේ සොයාගැනීම් සලකා බැලෙනු ඇත.

# 7. ජාතික සම්පත්

## 7.1 ආහාර සුරක්ෂිතතාවය සහ පෝෂණය

අපගේ දැක්ම වන්නේ දැන් සහ අනාගතයේදී ආරක්ෂිත, සෞඛ්‍යදායී, තිරසර සහ සමාජමය ලෙස අන්තර්ග්‍රාහී ආහාර ක්‍රමයක් සංවර්ධනය කිරීම තුළින් සියලු දෙනා සඳහා ආරක්ෂිත, සංස්කෘතිකව සුදුසු සහ පෝෂණීය ආහාර වෙත පිවිසුම සහතික කිරීමයි. විස්තීර්ණ අධ්‍යයනකට පසු, පළමු වසර අවසානයේදී සහ ඉන්පසු සෑම වසර තුනකට වරක්ම ජාතික ආහාර පද්ධතියේ තත්වය පිළිබඳ වාර්තාවක් පාර්ලිමේන්තුවේ සභාගත කෙරෙනු ඇත. මෙම වාර්තාව තුළ නිෂ්පාදන ධාරිතාව, ඉඩම් පරිහරණය, ශ්‍රම බලකාය සහ ආහාර ආරක්ෂාව වැනි ආහාර පද්ධතිය පිළිබඳ වැදගත් තොරතුරු මෙන්ම ආහාර ගැනීම, ආහාර පරිභෝජන රටා සහ ආහාරවල අනාරක්ෂිත බව ඇතුළු වැදගත් සෞඛ්‍ය දර්ශකයන් සම්බන්ධ තොරතුරු ඇතුලත් වෙනු ඇත.

ජාතික ජානමය සම්පත් සංරක්ෂණය කර කළමනාකරණය කරගත හැකි පරිදි අපි දේශීය ධාන්‍ය ජාන බැංකුවක් හා තෘණ ජාන බැංකුවක් ස්ථාපිත කරන්නෙමු. මෙම ජානමය සම්පත්, කෘෂිකාර්මික ඵලදායිතාව වැඩි දියුණු කිරීමට සහ නව ආහාර නිෂ්පාදන නිර්මාණය කිරීමට භාවිතා කෙරෙනු ඇත. එය කර්මාන්තය ශක්‍ය කර ආහාර ආරක්ෂාවට සහය දෙනු ලබන අතර කාලගුණ විපර්යාසයන්ට අනුව කටයුතු කිරීමට නිෂ්පාදකයින්ට උපකාර කරයි. ඒ සඳහා අදාළ පාර්ශ්වකරුවන් සමග ආහාර ආරක්ෂණය සහ ළඟා කරගත යුතු පෝෂණ ඉලක්ක සම්බන්ධව විස්තරාත්මක අදහස් විමසීම හරහා අපි සාගින්න ශුන්‍ය කිරීම සඳහා වන ජාතික ආහාර සැලැස්මක් සංවර්ධනය කරන්නෙමු.

අපි, ගොවීන්ට සහ වෙනත් බෝග නිෂ්පාදකයින්ට නව කෘෂිකාර්මික තාක්ෂණයන් වෙත පිවිසීමට උපකාර කරන්නෙමු. NRSL ප්‍රජාවන්ගේද ඇතුළුව ජාත්‍යන්තර පර්යේෂණ සහ සංවර්ධන විශේෂඥතාවන් ඉලක්කගත පාර්ශ්වකරුවන් සමග බෙදා හදා ගැනිම තුළින් තිරසර, ආරක්ෂිත සහ පෝෂණීය ආහාර වර්ග සංවර්ධනය කරගැනීමට හැකිවෙනු ඇත. සම්පත් දුර්ලභ බව වැලැක්වීමට සහ ආහාර විවිධාංගිකරණය වැඩි දියුණු කිරීම පිණිස 3-D මුද්‍රණ හරහා ආහාර මුද්‍රණය කිරීම වැනි ඩිජිටල් තාක්ෂණයන් ගවේෂණය කරන්නෙමු.

තීරණ ගැනීම සඳහා මූලික වන ආහාර නිෂ්පාදනයේ තත්වය පිළිබඳව ඩිජිටල්කරණය කරන ලද දත්ත එක් රැස් කිරීම කාර්යක්ෂමව කළ යුතුය. ඩිජිටල් නවෝත්පාදනයන් මගින් අත්‍යන්ත සුපිරි වෙළෙඳ සැල් යථාර්ථයක් බවට පත් කරමින් ආහාර බෙදාහැරීමේ නව මාර්ග නිර්මාණය කෙරෙනු ඇත. අනාගතයේදී ගොවීන් අන්තර්ජාලය හරහා සෘජුවම තම පාරිභෝගිකයන්ට තම නිෂ්පාදන අලෙවි කරනු ඇත. ආහාර ආරක්ෂණය සම්බන්ධව යාවත් කාලීන කරන ලද දත්ත, ප්‍රතිපත්ති සහ පර්යේෂණ අපි අධීක්ෂණය කරන්නෙමු. ආහාර නිෂ්පාදනය සහ එහි කාර්ය සාධනය පිළිබඳ මූලික තොරතුරු ගොනු කරන ආහාර පද්ධතියේ තත්වය පිළිබඳ වාර්තාව සෑම වසර පහකටම වරක් පල කෙරෙනු ඇති අතර අපගේ ජාතික ආහාර සැලසුම් ඉලක්කවල ප්‍රගතිය අධීක්ෂණය කෙරෙනු ඇත. වසර හතරකට පසු අපි අපගේ ආහාර ආරක්ෂණ ප්‍රතිපත්තිය අධීක්ෂණය කරන්නෙමු.

---

## 7.2 ජල සුරක්ෂිතතාව

ජල සුරක්ෂිතතාවේ අරමුණ වන්නේ සියලුම පුරවැසියන්ට පිරිසිදු, ආරක්ෂිත සහ දැරිය හැකි පානීය ජලය සහ සනීපාරක්ෂාව අවම වියදමකින් ලබාගැනීමට සමාන හැකියාවක් ඇති කිරීමයි. ජලය ජීවනෝපායන් පවත්වාගැනීමට, මානව යහ පැවැත්ම, සමාජ ආර්ථික සංවර්ධනය සහ පරිසර පද්ධති සඳහා මූලික වන බැවින් ජල සුරක්ෂිතතාව මූලික මානව අයිතියකි. පසුගිය දශක කිහිපය තුළ ශ්‍රී ලංකාව තුළ පුද්ගලීකරණය කළ ජල වෙළෙඳපොළක් ස්ථාපිත කිරීමේ උත්සාහයන් ක්‍රියාත්මක විය. ජලය පුද්ගලීකරණය කිරීම අපගේ ජනතාවගේ මූලික මානව හිමිකම් ඉවත දැමීමක් ලෙස අපි දකින්නෙමු.

ජල සුරක්ෂිතතාව සඳහා ජලාශ සහ වේලි, ජල පොම්පාගාර, බෙදාහැරීම් ජාල, ජල විදුලි බලාගාර සහ අදාළ ජල යටිතල පහසුකම්, ස්වභාවික සහ සිතාමතා කරන කටයුතු මගින් දූෂණය වීමෙන් මෙන්ම ගංවතුර, නියං, සුනාමි වැනි සිද්ධිවලින් මෙන්ම දේශපාලන හා සිවිල් කලකෝලාහලවලින් ආරක්ෂා කළ යුතු ය. එමෙන්ම ජල නාස්තිය අවම කළ යුතුය. පානීය ජලය දූෂණය වීමෙන් ආරක්ෂා කිරීම සඳහා වන උද්ඝෝෂණයන්ගෙන් පෙනී යන්නේ ජල සුරක්ෂිතතාවයට එල්ල වන අභියෝගයන් පෙර දැකීමට අසමත් වූ බව සහ තරගකාරී භාවිතා කරන්නන් අතර තිරසරව සහ ආර්ථික කාර්යක්ෂමතාවයකින් යුතුව ජලය බෙදී යාමට නිසි නියාමන සහ පරිපාලන යාන්ත්‍රණයක් නොමැති බවයි ජල ගුණාත්මක බව සම්බන්ධ ගැටළුවලට හේතුවන්නේ, මල එක්වීමෙන් ඇතිවෙන දූෂණය, බොර ජලය, සුපෝෂණය (eutrophication), කාබනික දූෂණය, කෘෂි රසායන භාවිතය ආදිය බව සොයාගෙන ඇත. කෘෂිකාර්මික අපද්‍රව්‍යවල අඩංගු අධික කෘෂි රසායන සහ පොහොර භූජලය මෙන්ම පෘෂ්ඨීය ජලයද දූෂණයට ලක් කරයි.

අපගේ දැක්ම වන්නේ ජලයේ ඵලදායී අගය උපරිම කරමින්, දීර්ඝ කාලීනව ජල පාරිභෝගිකයින්ට, කර්මාන්තවලට සහ රජයට දැරීමට සිදු වන පිරිවැය අවම කරමින්, නිසි ජල පාලන සැලසුමක් තුළින් ජලය මත රඳා පවතින පරිසරය ආරක්ෂා කරමින් සමාජයට ජල සම්පත් වෙතට ආරක්ෂිත පිවිසුමක් ලබාදීමයි. ජනතාවගේ සුව සෙත පිණිස ජල සුරක්ෂිතතාව පිළිබඳව සලකා බැලිය යුත්තේ, දේශපාලන බලය ලබාගැනීමේ අරමුණින් කෙටි කාලීනව නොව දීර්ඝ කාලීන වශයෙනි. ආයෝජන තීරණ, තුලිත සමාජ, ආර්ථික සහ පාරිසරික විශ්ලේෂණයක් මත පදනම් විය යුතු අතර විද්‍යාත්මක උපදෙස් මගින් පාරදෘශ්‍ය සහ තරගකාරී ක්‍රියාවලීන් තුළින් ක්‍රියාත්මක කළ යුතුය. යහපත් ජල ප්‍රතිපත්ති සංවර්ධනය සහ ක්‍රියාත්මක කිරීම මෙන්ම පාලන ක්‍රමයන්

හරහා ස්වභාවික සහ මිනිසා විසින් නිර්මිත ජල සුරක්ෂිතතා ගැටළු වඩා හොඳින් නිරාකරණය කරගත හැකිය.

සාක්ෂි මත පදනම් වූ ප්‍රායෝගික මූලාරම්භයන් යොදාගැනීම, වැඩි දියුණු කරගත් අවබෝධය මත ගොඩනැගුණු සැලසුම් සහ ජල සම්පත් වඩා කාර්යක්ෂම ලෙස කළමනාකරණය කිරීම හා කාන්දු ජල සම්පාදනය, ජලය නැවත භාවිතය සහ වැසි ජලය එක් රැස් කරගැනීම වැනි සරල නව සංරක්ෂණ තාක්ෂණයන් යොදා ගැනීම සම්බන්ධව අපි අවධාරණය කරන්නෙමු. ප්‍රමාණවත් තරම් සහ සුරක්ෂිත පොදු ජල සැපයුම සහතික කරමින් ගෘහස්ථ අරමුණු සඳහා යොදා ගැනීම හා දියුණු කිරීම හා සම්බන්තධ වග වීම ද ඇතුළත්ව අපි ජල සම්පත් තිරසර ලෙස කළමනාකරණය කිරීම සඳහා ඉඩකඩ සලසා දෙන්නෙමු.

අපි ජල සම්පත් කලමනාකරණයේ පාරදෘශ්‍යභාවය සහ සුරක්ෂිත බව තහවුරු කරන අතර අදාළ සියළු තීරණ ගැනීමේ දී, විශේෂයෙන්ම්, නාගරික හා කලාපීය ප්‍රදේශවල පොදු පානීය ජල මූලාශ්‍රවල  ජල ගුණාත්මක බව ඒකීය ලෙස ආරක්ෂා කිරීමේදී, ජලයේ ගුණාත්මක බව පිළිබඳ පිරිවිතරයන් සැලකිල්ලට ගන්නා බව පැහැදිලිව සඳහන් කරන්නෙමු. ජල සැලසුම්කරණය තුළදී, මහජන ජල සැපයුමේ වර්තමාන හා අනාගත භාවිතය සඳහා ව්‍යවස්ථාපිත වෙන්කිරීම් සීමාවන් සහ ව්‍යවස්ථාපිත ජල වෙන්කිරීමේ සැලසුම් සකසමින්, මහජන ජල සැපයුම සඳහා ඉහළම ප්‍රමුඛතාවක් ලබාදෙනු ලැබේ  ජල සුරක්ෂිතතාවය පිළිබඳ ගැටළු සම්බන්ධව කටයුතු කිරීමට ජලවිද්‍යාවන්ගේ නව සොයාගැනීම් යොදාගන්නා බව තහවුරු කිරීමට මෙන්ම එක් රැස් කරගත යුතු දත්ත තීරණය කිරීමට, අපි ජල විද්‍යාඥයන් සහ ප්‍රතිපත්ති සකසන්නන් අතර තොරතුරු හුවමාරුව වැඩි දියුණු කිරීම සඳහා ඔවුන් අතර ඒකාබද්ධ යාන්ත්‍රණයක් ස්ථාපිත කරන්නෙමු. එවැනි දත්ත රටේ ජල ගුණාත්මක භාවය හෝ සුරක්ෂිතතාව වැඩි දියුණු කිරීම සඳහා යොදාගැනීමට පහසුවෙන් ලබාගත හැකිවන පරිදි විවෘත කළ යුතුය.

---

## 7.3 බලශක්තිය සුරැකීම

එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන ඉලක්කයන්ගේ 7 වන ඉලක්කය සමඟ පෙළ ගැන්වීම් මගින් බලශක්තිය වෙත විශ්ව ව්‍යාපී ප්‍රවේශයක් ළඟා කරගත හැකි වෙනු ඇත. මෙමගින් ෆොසිල ඉන්ධන මත රඳා පැවතීම අඩු කෙරෙනු ඇති අතර 2030 වන විට නිශ්චිත බලශක්ති භාවිතය භාගයකින් අඩු වෙනු ඇත. බලශක්ති අංශය තුළ වැඩි සහයෝගීතාවය ජාතික බලශක්ති සුරක්ෂිතතාව වැඩි දියුණු කරනු ඇති අතර බලශක්ති සැපයුම සඳහා වන පිරිවැයද අවම කරනු ඇත. එමෙන්ම මිල වාෂ්පශීලතාව මගින් ඇතිවන අයහපත් බලපෑම්ද අඩු කරනු ඇත. බලශක්ති සහයෝගිතාව ප්‍රවර්ධනය කිරීම කාලගුණ විපර්යාස අවම කිරීමේ ඵලදායී යාන්ත්‍රණයක් වනු ඇත. දේශ සීමා හරහා කෙරෙන බලශක්ති වෙළෙඳාම, එක් එක් රටවල නව පරම්පරාවේ ධාරිතාවන් ඉදිකිරීමේ අවශ්‍යතාවයද අවම කරනු ඇත.

කෙසේ වෙතත්, අපගේ දැක්ම වනුයේ බලශක්තියෙන් ස්වයංපෝෂිත, ආනයනය කරන තෙල් සහ තෙල් නිෂ්පාදන මත රඳා නොපවතින හා වායු දූෂණයට දායකත්වයක් නොදක්වන ජාතියක් බිහි කිරීමයි. අප සිටිනුයේ කලාපය තුළ න්‍යෂ්ඨික බලය මගින් බලපෑම් ලබන දේශපාලනික වශයෙන් තරගකාරීත්වයක් සහිත කලාපයක වන බැවින්, මෙය බලශක්ති සුරැකුම සඳහා අවශ්‍ය පූර්ව තත්වයක් බව අපි විශ්වාස කරන්නෙමු. අපගේ දැක්ම සාක්ෂාත් කරගැනීමට, සියලුම පුනර්ජනනීය සහ වෙනත් දේශීය සම්පත්වල පූර්ණ විභවය ග්‍රහණය කරගැනීමට අදහස් කරන්නෙමු.

පුනර්ජනනීය බලශක්තිය සහ නව බලශක්ති තාක්ෂණය අපගේ ආර්ථිකය සඳහා ප්‍රමුඛතා අංශ බව අපි හඳුනාගනිමු. අපට ප්‍රයෝජනයට ගත හැකි පුනර්ජනනීය බලශක්ති සම්පත් විශාල ප්‍රමාණයක් ඇත. වෙරළාශ්‍රිත සුළං ගවේෂණය සඳහා සැලකිය යුතු අවස්ථාවන් පවතින, විශේෂයෙන්ම, වෙරළබඩ ප්‍රදේශ වල සුළං උත්පාදනය සඳහා අපට ප්‍රබල වර්ධන ශක්‍යතාවක් ඇත. වාණිජ හා කර්තමාන්ත ක්ෂේත්‍රවල වැදගත් විභවතාවයක් සහිත, පියසි මත ඉදි කරන සූර්ය ප්‍රකාශ වෝල්ටීය පද්ධතිවල අඛණ්ඩ වර්ධනයක් දැකීම සඳහා අපි එය අනිවාර්ය සම්මත අංගයක් බවට පත් කරමු. සූර්තය ප්‍රකාශ වෝල්ටීය පද්ධති දීපව්‍යාප්ත ලෙස දියත් කෙරෙනු ඇත. අනාගතය උදෙසා බහුල වලස ස්වාභාවික සම්පත් අනාවරණය කර කරගන්නට ජාලක වර්ධනය උපකාර වෙනු ඇත.

අපි ව්‍යාපාර, සමුපකාර සහ පර්යේෂණ ප්‍රජාවන් සංවර්ධනය වෙන දේශීය ව්‍යවසායකත්වය සහ පර්යේෂණ ධාරිතාව සමග සම්බන්ධ කරගැනීමට ඔවුන්ට දිරිදීමනාවන් ලබාදෙන්නෙමු. අපි, බලශක්ති ගිණුම්කරණය, සුහුරු මානනය සහ බුද්ධිමය දත්ත තදබද කළමනාකරණය වැනි තොරතුරු තාක්ෂණ යෙදුම් සඳහා දිරිදෙන්නෙමු.  පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍ර වෙතින් බෙදා හරින ලද සහ විචල්‍ය උත්පාදනයන් ඵලදායී ලෙස භාවිතා කිරීමට සුහුරු ජාලක ප්‍රවර්ධනය කෙරෙනු ඇත. නව, නැගී එන පුනර්ජනනීය ඉන්ධන ප්‍රභවයන් හා කාර්යක්ෂම බලශක්ති අනුවර්තතනය සහ අවසාන පරිශීලන තාක්ෂණ වේද හඳුන්වා දීම, යොද ගැනීම හා ක්‍රියාත්මක කිරීම පිළිබඳ පර්යේෂණ හා සංවර්ධන කටයුතු අපි ප්‍රවර්ධනය කරන්නෙමු. ආරම්භක තාක්ෂණ වේදයන් පෝෂණය කරන අයට අපි මූල්‍ය දිරිගැන්වීම් සහ බදු ප්‍රතිලාභ ලබා දෙන්නෙමු.

ජාතික බලශක්ති ආරක්ෂණ ඇගයීමක් සිදු කිරීම සඳහා අපි ජාතික බලශක්ති අධිකාරියක් (NEA) ස්ථාපනය කරන්නෙමු. දශකයක කාල රාමුවක් තුළ තිරසර පුනර්ජනනීය බල උත්පාදනයක් ළඟා කරගැනීමේ ඉලක්කයක් සහිතව පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍රයන් යොදාගන්නා ආකාරය එමගින් නිර්දේශ කරනු ඇත.

NEA මගින් රජය විසින් මෙතෙක් සිදු කළ කටයුතු මත පදනම්ව පුනර්ජනනීය බලශක්ති සැලසුමක් (REAP) සංවර්ධනය කරනු ඇත. REAP සැලසුම තුළින් ප්‍රජා බලශක්ති ව්‍යාපෘති සඳහා සහය ලබාදෙමින්; දැරිය හැකි බලශක්ති සැපයුමක් සහතික කරමින්; බලශක්ති ගබඩාව, සුහුරු ජාල සහ ක්ෂුද්‍ර ජාල වැඩි දියුණු කිරීම මගින් අපගේ බලශක්ති පද්ධතිය සුහුරු, ආරක්ෂිත සහ විශ්වසනීය බවට පත් කරමින්; නව බලශක්ති තාක්ෂණ අංශය වැඩි දියුණු කිරීම තුළින් රැකියා නිර්මාණය කිරීම, ආයෝජන ආකර්ෂණය කිරීම සහ ආර්ථිකය වර්ධනය කරමින්; නිවාස, ව්‍යාපාර සහ ප්‍රජාවන් සවි බලගන්වා ඒ හා සම්බන්ධ කෙරෙනු ඇත.

---

## 7.4 පාරිසරිකව තිරසර සංවර්ධනය

අපගේ අනාගත පරපුර වෙනුවෙන් කාලගුණ විපර්යාස අවම කිරීම සඳහා හරිතාගාර වායු අඩු කිරීම වෙත දායක වීමට සෑම පුරවැසියෙකුටම වගකීමක් ඇත. අපගේ දැක්ම වන්නේ, ජීවත්විය හැකි සහ සමෘද්ධිමත් රටක් සඳහා සහය දක්වන පාරිසරිකව තිරසර සංවර්ධනයක් සාක්ෂාත් කරගැනීම සඳහා ශ්‍රී ලාංකිකයන් සියලුදෙනා සමග කටයුතු කිරීමයි. අපගේ ප්‍රතිපත්තිය, තිරසර සංවර්ධන ඉලක්ක 2030 සමග අනුගත වෙන අතර රජයේ ප්‍රබල ක්‍රියාමාර්ගයන් මත රඳා පවතිනු ඇත.

ජල සුරැකුම් සහ බලශක්ති කාර්යක්ෂම මූලාරම්භයන් ඉලක්ක කරමින් පරිසරයට වන බලපෑම අවම කරන කාලගුණ හිතෛෂී ගොඩනැගිලි ව්‍යාපෘති හඳුන්වා දෙන්නෙමු. කාලගුණ හිතෛෂී තාක්ෂණයන් වැඩි වශයෙන් භාවිත කරමින් ගල් අඟුරු සහ බලශක්ති වැයවෙන යටිතල පහසුකම් ක්‍රමයෙන් ඉවත් කෙරෙනු ඇත.

## 7.5 අපද්‍රව්‍ය කළමනාකරණය සහ සම්පත් ප්‍රතිසාධනය

අපගේ දැක්ම වන්නේ පරිභෝජනය අඩු කිරීමෙන් සහ ඉවත ලන ද්‍රව්‍ය නැවත භාවිතා කර හෝ ප්‍රතිචක්‍රීකරණය කිරීමෙන් අපද්‍රව්‍ය ශුන්‍ය රටක් බිහි කරලීම උදෙසා කටයුතු කිරීමයි. ප්‍රමාණවත් කාල සීමාවක් තුළ මෙම ඉලක්කය ළඟා කරගැනීමට, අපි අපද්‍රව්‍ය කළමනාකරණ ගැටළුව ඉතා ඉක්මණින් විසඳා ගත යුතුව ඇත. අපද්‍රව්‍ය කළමනාකරණය කිරීමේදී අපි ලොව පුරා භාවිතා කෙරෙන නිසි නවෝත්පාදන ප්‍රතිසාධන සහ අපහරණ තාක්ෂණයන් සහ ක්‍රමයන් යොදා ගන්නෙමු. උදාහරණයක් ලෙස ඩෙන්ඩ්‍රො දියර බලශක්ති (DLE – 'කසළ ශුන්‍ය' සමීප) හා ස්මාර්ට් බින් තාක්ෂණවේදයන්, පරිසර හිතෛෂී ස්වභාවිකව දිරාපත් විය හැකි නිෂ්පාදන, සූය බලැති අපද්‍රව්‍ය ශෝධක යන්තර යනාදිය යොද ගැනෙනු ඇත. එවැනි තාක්ෂණයන් සහ ක්‍රම මත පදනම්ව, අපද්‍රව්‍ය සම්පතක් ලෙස භාවිතා කරමින් ලාභදායී ව්‍යාපාරද ඇරඹිය හැකිය.

ශ්‍රී ලංකාව තුළ පුළුල්ව පැතිරී පවතින දූෂණ ක්‍රියාවන් සම්බන්ධව කටයුතු කිරීම ඉතා වැදගත් කර්තව්‍යයකි. මෙය සිදු කළ හැකි එකම මග වන්නේ ස්වාධීන පුළුල් පදනම් දූෂණ විරෝධී කොමිෂන් සභාවක් (IBAC)පත් කිරීමයි. මේ මොහොතේ ක්‍රියාත්මක වන කිසිදු දූෂණ විරෝධී ආයතනයකට වඩා ස්වාධීන පුළුල් පදනම් දූෂණ විරෝධී කොමිෂන් සභාවට (IBAC) බලය හිමි වෙනු ඇති අතර නිරන්තරව සිදුවන දූෂණ ක්‍රියාවලට එරෙහිව සටන් කරනු ඇත.

---

## 7.6 ආපදා කළමනාකරණය සහ සමාජ ප්‍රත්‍යස්ථිතිය

ආපදාවන් මාරාන්තික වන අතර යටිතල පහසුකම් සහ ආර්ථිකයට හානි කරනු ලබයි. ගෝලීය භූමිකාවේ අංගයක් බවට පත් වී ඇති ස්වාභාවික විපත් පුද්ගලික, සමාජීය, ආර්ථික හා පාරිසරික බලපෑම් ඉදිරියටත් ඇති කරනු ඇත. දකුණු ආසියාව යනු ආපදාවලට ඉහළ නිරාවරණයක් ඇති කලාපයකි. කලාපයේ ආපදාවල බලපෑම් නිසා දහස් ගණන් ජනතාවට දිළිඳු බවින් මිදීමටද අපහසුව ඇත.

නැවත නැවත සිදුවෙන ආපාදාවන් සහ කම්පනයන් පුද්ගලයන්ගේ, ප්‍රජාවන්ගේ හා සමාජයන්ගේ ප්‍රත්‍යස්ථිතිය අඩු කරලයි. ආපදාවන් මගින් ඇතිවන මනෝ සමාජයීය ප්‍රතිඵලයන් දීර්ඝ කාලීන විය හැකි අතර යහපැවැත්මට බාධා ඇති කරමින් සාමය සහ මානව හිමිකම්වලට තර්ජනයන් එල්ල කළ හැකිය. මෙය, කාලගුණ විපර්යාස, නාගරීකරණය සහ ජනවිකාස වෙනස්කම් සමග තවත් තීව්‍ර විය හැකිය. එබැවින් අවදානම අඩු කිරීම සහ ප්‍රමුඛතාවක් ලෙස ඉදිරි ආපදා සඳහා ප්‍රත්‍යස්ථිතිය ඇති කිරීම මගින් ජීවිත සුරැකෙනු පමණක් නොව තිරසර ආර්ථික වර්ධනයකටද මග සලසනු ඇත.

අප විශ්වාස කරන පරිදි ස්වභාවික ආපදා හා උපද්‍රව මග හැරිය නොහැකි වන නමුත් ඒ හා සම්බන්ධ වන විඳවීම්, විනාශයන් සහ ජීවිත අහිමිවීම් එසේ නොවේ, ඒවා මඟ හැරිය හැකිය. අවදානම් විශ්ලේෂණය සහ කළමනාකරණය, අනතුරට ලක් වීමේ ඉඩකඩ අවම කිරීම සහ අවදානම් අවම කිරීමට හා වැඩි ප්‍රත්‍යස්ථිතියක් ඇති කරගැනීම සඳහා හැකියාවන් ගොඩනැංවීම හරහා සමාජ ප්‍රත්‍යස්ථිතිය සංවර්ධන කරගැනීමට අවශ්‍ය කටයුතු කරන්නෙමු. ආපදා කළමනාකරණය සහ සමාජ ප්‍රත්‍යස්ථිතිය මත ආයෝජනය කිරීම, සංවර්ධන ව්‍යායාම තිරසර කිරීමේ ලා අවශ්‍ය වන පූර්ව කොන්දේසියකි. තිරසර සංවර්ධනයක් ළඟා කරගැනීමට නම්, සංවර්ධනය සහ අවදානම් අඩු කිරීම අනුකලනය කිරීම තීරණාත්මක වන බවට අපි විශ්වාස කරන්නෙමු. ආපදාවන් පැමිණීමට පෙර අවදානම් අඩු කිරීම වෙත ආයෝජනය කිරීමට අදාළ කටයුතු අප විසින් සිදු කෙරෙනු ඇත. අවදානමට ලක්වන, දිළිඳු සහ ආන්තීකරණය වූ ජනතාව වඩා හොඳින් සූදානම් කරන තරමට අපට වේගයෙන් ප්‍රතිසාධනය විය හැකිය.

ආපදා ප්‍රත්‍යස්ථිතිය සහිත, වර්තමාන හා අනාගත අවදානම් දැකීමට හැකි, එම අවදානම් අඩු කිරීමට හා කළමනාකරණය කිරීමට හැකි, වෙනස්කම්වලට අනුගත වීමට හැකි හා ආපදාවලින් ඉක්මණින් සුවපත් වන, ආපදා ප්‍රත්‍යස්ථිතියෙන් යුත් ශ්‍රී ලංකාවක් බිහි කිරීමට අපි උත්සාහ දරන්නෙමු. ආපදා කළමනාකරණය සම්බන්ධ ආයතනික ක්‍රියාවලීන්වල විවිධ පාර්ශ්වකරුවන් විසින් දරනු ලබන භූමිකාවන් වෙත අවධානය යොමු කරන අතර ස්වභාවික ආපදාවන් කළමනාකරණය කිරීමේ අදියරයන් අපි ඉස්මතු කරන්නෙමු.

# 8. වගකීම් සහගත ගෝලීය පුරවැසියා

## 8.1 ජාත්‍යන්තර සබඳතා හා විදේශ ප්‍රතිපත්තිය

අනේවාසික ශ්‍රී ලාංකික ප්‍රජාව, ශ්‍රී ලංකාවට උපකාර කිරීමේ මගක් ඇත්නම් ඒ සඳහා සහය දෙනු ඇත. කෙසේ වෙතත් ඔවුන් තම මව්රට වෙනුවෙන් වියදම් කරන සෑම ඩොලරයක්ම අපතේ නොයවන බව හා අනවශ්‍ය ලෙස අවසන් නොවන බවට සහතිකයක් ඔවුන්ට අවශ්‍යය.

අනේවාසික ශ්‍රී ලාංකික ප්‍රජාවේ වැදගත්කම සහ අනාගත ශ්‍රී ලංකාව සම්බන්ධ තීරණ ගැනීමේදී හා ප්‍රතිපත්ති සැකසීමේදී දායකත්වයක් ලබාදීමට ඔවුන්ට ඇති හිමිකම නිල වශයෙන් පිළිගැනීම රජයේ වගකීම බව අපි සලකමු. සියලුම ආයතනික, ව්‍යුහාත්මක සහ සංස්කෘතික බාධකයන් සමාලෝචනය කිරීමෙන් පසු, අනේවාසික ශ්‍රී ලාංකිකයන්ට සක්‍රිය භූමිකාවක් දැරිය හැකි පහසුකම් සැපයීමේ ක්‍රියාවලියක් හඳුන්වා දෙනු ඇත. ශ්‍රී ලංකාව නීතිය මත පදනම් වන සමාජයක් වෙනු ඇති බවට තහවුරු කරන ස්ථිර ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටීන් ඔවුන්ට අවශ්‍යය.

ඡන්දය ප්‍රකාශ කිරීමට සහ ඉඩම්/දේපළ හිමිකාරීත්වය දැරීමට අයිතිය සහිත ද්විත්ව පුරවැසිභාවය සඳහා අදාළ නීති හඳුන්වාදෙමින්, අනේවාසික ශ්‍රී ලාංකිකයන් ශ්‍රී ලාංකීය ජාතියේ අත්‍යවශ්‍යයික කොටසක් බව අපි පිළිගනිමු. නාමකරණයන්, සමාජ තනතුරු, සාහිත්‍යය යනාදිය සම්බන්ධව කටයුතු කිරීමද ඇතුළුව නව සමාජ ධර්මතාවන් තුළින් අනේවාසික ශ්‍රී ලාංකික ප්‍රජාව අභ්‍යන්තර පාර්ශ්වකරුවන් ලෙස පිළිගැනීමේ සංස්කෘතියක් ඇති කිරීමට අදාළ ක්‍රියාමාර්ගයන් ගනු ඇත.අනේවාසික ශ්‍රී ලාංකික ප්‍රජාවේ ගවේෂණයන් සඳහා සුදුසු සහ ප්‍රමුඛතා ව්‍යාපෘතීන් හඳුනාගැනීමට බහුපාර්ශ්වික පාර්ලිමේන්තු කාරක සභාවක් ස්ථාපිත කෙරෙනු ඇත.

---

## 8.2 අභ්‍යන්තර වෙළෙඳාම සහ හවුල්කාරීත්වය

රජය, ජාත්‍යන්තර වේදිකාවේ පවතින අවස්ථාවන් සොයාගත යුතුය. වෙළෙඳාම සහ ආයෝජනය විෂය භාර අමාත්‍යවරයා, අමාත්‍ය මණ්ඩලයේ සිටින අනෙකුත් අමාත්‍යවරුන් සමග සමීපව වැඩ කටයුතු කළ යුතුය. මෙහිදී කර්මාන්ත, කෘෂිකර්මාන්ත සහ භාණ්ඩාගාර විෂයන් සහිත අමාත්‍යවරු විශේෂයෙන් වැදගත් වේ.

ආයෝජනය කිරීමේ හැකියාව ඇති ආයෝජකයින්ට දිරිදීමනා ලබා දීම සම්බන්ධව රජය තීරණ ගත යුතු අතර ශ්‍රී ලාංකීය නිෂ්පාදන අලෙවි කිරීම සඳහා ඉඩ ඇති ජාත්‍යන්තර වෙළෙඳපොළ සම්බන්ධව පර්යේෂණ සිදු කළ යුතුය. එමෙන්ම ජාත්‍යන්තර වෙළෙඳපොළ සඳහා ශ්‍රී ලංකාව නිපදවිය යුතු භාණ්ඩ සහ සේවාවන් කවරේද යන්න හඳුනාගැනීමද වැදගත් වේ. වඩා විශාල සහ පුළුල් වෙළෙඳ අවස්ථා සඳහා ශ්‍රී ලංකාව තම නිෂ්පාදන පරාසයද විවිධාංගිකරණය කළ යුතුව ඇත. එය, ලොව පුරා කුඩා ව්‍යාපාරවලට තාක්ෂණික සේවාවන් ලබාදීම වැනි කුඩා පරිමාණ කටයුත්තක සිට මෝටර් වාහන නිෂ්පාදනය වැනි විශාල නිෂ්පාදන අවස්ථාවන් දක්වා විහිදේ.

එමෙන්ම, දේශීයව නිෂ්පාදිත භාණ්ඩවලට විදේශ ප්‍රාග්ධන ආයෝජනයන් ආකර්ෂණය කරගැනීම සඳහා රජය තම ප්‍රසම්පාදන භාවිතයන් සහ බදු සැකසුම් ප්‍රති ඇගයුම් කළ යුතුය. උදාහරණයක් ලෙස, තම නිෂ්පාදන අංගන ශ්‍රී ලංකාවට ගෙන එනු ලැබුවහොත් සියලුම රජයේ වාහන දේශීයව මිලදී ගැනීමට සූදානම් බවට රජය ජාත්‍යන්තර වාහන නිෂ්පාදකයන් හට ඉඟි කළ යුතු බවට අපි විශ්වාස කරන්නෙමු.

---

## 8.3 කලාපීය සහයෝගීතාවය සහ ඒකාබද්ධතාව

කලාපයේ රටවල් අතර වන ඒකාබද්ධ අභියෝගයන් සහ අවස්ථාවන් සඳහා වඩා හොඳින් මැදිහත් වීමට හැකි වන පරිදි, දැනටමත් පවතින කලාපීය ගිවිසුම් සහ ස්ථාපිතයන් වැඩි දියුණු කිරීමට දකුණු ආසියාව තුළ සහයෝගිතාව සහ ඒකාබද්ධතාව පිළිබඳ ප්‍රතිපත්තියක් අපි ප්‍රවර්ධනය කරන්නෙමු. එමෙන්ම, විසඳා නොමැති ජනවාර්ගික, ආගමික, භාෂාමය සහ හෙජමොනික ගැටළු හේතුවෙන් අපට විශාල දේශපාලන සහ ආරක්ෂක සංකීර්ණතාවන් ප්‍රමාණයක්ද ඇත. මීට අමතරව,කලාපීය ඒකාබද්ධතාව සඳහා දරන උත්සාහයක්, යම් නිශ්චිත සාමාජිකයෙකුගේ ජාතික වැදගත්කමට බලපාන්නේ නම් එය තවත් සංකීර්ණ වේ.

හවුලේ භුක්ති විඳින සෞඛ්‍ය සේවා, අධ්‍යාපනය, යුක්තිය, සංචාරක හා පාරිසරික ගැටළු ආදියට පොදු ප්‍රවේශයන් යොදා ගැනීම, අන්තර්-කලාපීය සංක්‍රමණික ප්‍රවාහ සමඟ කටයුතු කිරීම, මහා පරිමාණ බහු-දේශ යටිතල පහසුකම් ව්‍යාපෘති සම්බන්ධීකරණය කිරීම සඳහාත් වඩා විශාල කලාපීය වෙළඳපොළක ප්‍රතිලාභ බෙදා හදා ගන්නට ඉඩ දිය හැකි ආර්ථික ඒකාබද්ධ කිරීමක් සඳහාත් කලාපීය සහයෝගිතාව අත්‍යවශ්‍ය වන බව අපි දකිමු.

---

## 8.4 ශ්‍රී ලාංකීය ඩයස්පෝරා ප්‍රජාව

ශ්‍රී ලාංකීය ඩයස්පෝරාව, ශ්‍රී ලංකාවට උපකාර කිරීමේ මගක් ඇත්නම් ඒ සඳහා සහය දෙනු ඇත. කෙසේ වෙතත් ඔවුන් තම මව්රට වෙනුවෙන් වියදම් කරන සෑම ඩොලරයක්ම අපතේ නොයවන බව හා අනවශ්‍ය ලෙස අවසන් නොවන බවට සහතිකයක් ඔවුන්ට අවශ්‍යය.

ශ්‍රී ලාංකික ඩයස්පෝරා ප්‍රජාවේ වැදගත්කම සහ අනාගත ශ්‍රී ලංකාව සම්බන්ධ තීරණ ගැනීමේදී හා ප්‍රතිපත්ති සැකසීමේදී දායකත්වයක් ලබාදීමට ඔවුන්ට ඇති හිමිකම නිල වශයෙන් පිළිගැනීම රජයේ වගකීම බව අපි සලකමු. සියලුම ආයතනික, ව්‍යුහාත්මක සහ සංස්කෘතික බාධකයන් සමාලෝචනය කිරීමෙන් පසු, ශ්‍රී ලාංකික ඩයස්පෝරා ප්‍රජාවට සක්‍රිය භූමිකාවක් දැරිය හැකි පහසුකම් සැපයීමේ ක්‍රියාවලියක් හඳුන්වා දෙනු ඇත. ශ්‍රී ලංකාව නීතිය මත පදනම් වන සමාජයක් වෙනු ඇති බවට තහවුරු කරන ස්ථිර ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටීන් ඔවුන්ට අවශ්‍යය.

ඡන්දය ප්‍රකාශ කිරීමට සහ ඉඩම්/දේපළ හිමිකාරීත්වය දැරීමට අයිතිය සහිත ද්විත්ව පුරවැසිභාවය සඳහා අදාළ නීති හඳුන්වාදෙමින්, ශ්‍රී ලාංකීය ඩයස්පෝරාව ශ්‍රී ලාංකීය ජාතියේ අත්‍යවශ්‍යයික කොටසක් බව අපි පිළිගනිමු. නාමකරණයන්, සමාජ තහංචි, සාහිත්‍යය යනාදිය සම්බන්ධව කටයුතු කිරීමද ඇතුළුව නව සමාජ ධර්මතාවන් තුළින් ශ්‍රී ලාංකීය ඩයස්පෝරා ප්‍රජාව අභ්‍යන්තර පාර්ශ්වකරුවන් ලෙස පිළිගැනීමේ සංස්කෘතියක් ඇති කිරීමට අදාළ ක්‍රියාමාර්ගයන් ගනු ඇත.

ශ්‍රී ලාංකීය ඩයස්පෝරා ප්‍රජාවේ ගවේෂණයන් සඳහා සුදුසු සහ ප්‍රමුඛතා ව්‍යාපෘතීන් හඳුනාගැනීමට බහුපාර්ශ්වික පාර්ලිමේන්තු කාරක සභාවක් ස්ථාපිත කෙරෙනු ඇත.

# 9. කෘෂිකර්මය සහ පශු සම්පත්

## 9.1 කෘෂිකාර්මික අංශය ප්‍රතිසංස්කරණය කිරීම

සමස්ත ජනගහනයෙන් සියයට 80 කට වැඩි ප්‍රමාණයක් ග්‍රාමීය ප්‍රදේශවල ජීවත් වන බව සොයාගෙන ඇති අතර ඉන් සියයට 90 ක් ම දිළිඳු ප්‍රදේශ ලෙස සැලකේ. කෘෂිකාර්මික ඉඩම් බෙදී යාමේ අසංවිධානාත්මක ස්වභාවය නිසා මෙම ජන කොට්ඨාසවල දිළිඳු බව තුරන් කිරීමට ග්‍රාමීය සංවර්ධනය අත්‍යවශ්‍ය වේ.

ග්‍රාමීය දරිද්‍රතාවය අඩු කිරීමට නම් යටිතල පහසුකම් සංවර්ධනය අත්‍යවශ්‍ය වේ. වඩා හොඳ මාර්ග සහ ප්‍රවාහන ජාලයන් සැපයීම හා නවීන කෘෂි තාක්ෂණයන් භාවිතා කිරීමට මෙන්ම ක්ෂුද්‍ර සහ කුඩා පරිමාණ ව්‍යාපාර ආරම්භ කිරීමට අවශ්‍ය ප්‍රාග්ධනය ලබාගැනීම සඳහා දීර්ඝ කාලීන ණය පහසුකම් සැපයීම මගින් ඔවුන්ගේ තත්වය වඩා යහපත් අතර හැරෙනු ඇත.

කෘෂිකර්මාන්තය පිළිබඳ පාර්ලිමේන්තු විමර්ශන කාරක සභාවට  සමුද්දේශයන් සැපයීම වැදගත් වෙනු ඇත. ගොවි සමුපකාර පිහිටුවීම හෝ ගොවි-පාරිභෝගික-සේවක සමුපකාර එකතුන් පිහිටුවීම මෙන්ම ණය සමිති පිහිටුවීම සඳහ ඇති හැකියාවන් ගවේෂණය කෙරෙනු ඇත. නිෂ්පාදනයන් විවිධාංගීකරණය කිරීමට සහ ග්‍රාමීය ප්‍රජාවට සම්බන්ධ වීමට හැකි විවිධ ආකාරයේ සමුපකාර පිහිටුවීමට උපකාර කිරීම සඳහා හැකියාවන් තිබිය හැකිය. කෘෂිකාර්මික සේවකයන්ගේ, විශේෂයෙන් වතු අංශයේ, සාමූහික ක්‍රියාකාරකම් සඳහා පදනමක් ලෙස සුදුසු ගොවි සමුපකාර මාදිලියක් සංවර්ධනය කළ හැකිය. WSDE අධිකාරියේ කාර්යයන් ගණනාවට මෙවන් මූලාරම්භයන් වෙත පහසුකම් සැපයීමද ඇතුළත් වේ.

---

## 9.2 ධීවර කර්මාන්තය හා සමුද්‍ර සම්පත් අංශය ප්‍රතිසංස්කරණය කිරීම

දිවයිනක් වන ශ්‍රී ලංකාව, විශාල අභ්‍යන්තර ජල ප්‍රවාහයන්ගෙන් මෙන්ම ඓතිහාසික ධීවර කර්මාන්ත සම්ප්‍රදායකටද උරුමකම් කියයි; එය ජනතාව මිලියන 2.5 කට සෘජුව හෝ වක්‍රව ජීවනෝපායයන් සපයන්නකි. කෙසේ වුවත් මෙම සම්පත් නිසි ලෙස කළමනාකරණය කර නොමැති අතර නීති විරෝධී ධීවර භාවිතයන්, පාරිසරිකව තිරසර නොවන ධීවර කටයුතු සහ දූෂිත නිෂ්පාදනයන්, මෙම කර්මාන්තය තුළ බහුලව දැකිය හැකිය. වර්තමානයේදී අපට ඇත්තේ අරමුණට කිසිසේත් නොගැලපෙන අර්ධ වශයෙන් දූෂිත ඉහළ සිට පහළට තීරණ ගලා එන එළඹුමකි. පාර්ශ්වකරුවන් කේන්ද්‍ර කොටගත් සහභාගිත්ව මාදිලියක් අපි යෝජනා කරන්නෙමු. ලබාගත හැකි හොඳම විද්‍යාත්මක උපදෙස් මත පදනම්ව නවීනතම තාක්ෂණික නවෝත්පාදනයන් භාවිතා කරමින් මෙම වටින සම්පත් පාරිසරිකව තිරසර ආකාරයෙන් කළමනාකරණය කෙරෙනු ඇත.

නීති විරෝධී සහ තිරසර නොවන ධීවර භාවිතාවන් නැවැත්වීම තහවුරු කිරීමට අපි, අපගේ අසල්වැසි රටවල් සමග සහයෝගයෙන් කටයුතු කරන්නෙමු. මෙම වටිනා සම්පත අප කළමනාකරණය කරන ආකාරය වැඩි දියුණු කරගැනීම පිණිස, අප වැනිම වූ ජල මාර්ගයන් සහිත නවසීලන්තය සහ ජපානය වැනි රටවල විශේෂඥ උපදෙස් ලබාගැනීමටද කටයුතු කරන්නෙමු. අවශ්‍ය ආරක්ෂණයන් සහිතව දේශීය සහ විදේශීය වශයෙන් උනන්දුව දක්වන්නන් සමග හවුල්කාරීත්වයෙන් යුතුව වඩාත් ශක්‍ය, සහභාගිත්ව සහ පාරිසරිකව තිරසර ජලජීවී වගා කර්මාන්තයක් සංවර්ධනය කරන්නෙමු.

ඉහත අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා, ලද හැකි හොඳම විද්‍යාත්මක උපදෙස් මත පදනම්ව නව ජලජීවී වගා භාවිතයන් විමසන සහ ක්‍රියාත්මක කරන ධීවර සංවර්ධන මණ්ඩලයක් පිහිටුවනු ඇත. ධීවර සංවර්ධන මණ්ඩලය,අනුගමනය කරනු ලබන්නේ හොඳම එළඹුම් බව සහතික කරගැනීමට මෙන්ම ඒවා තිරසර වන්නේද යන්න සනාථ කරගැනීමට, අදාළ සියලු පාර්ශ්වකරුවන් සමග සහයෝගයෙන් හා අදාළ අමාත්‍යවරයාගේ අවසරය සහිතව කටයුතු කරනු ඇත.

ධීවර කර්මාන්තය තුළ පවතින වර්තමාන තත්වය සහ පවතින ව්‍යවස්ථාපිත සහ නියාමන රාමුව සමාලෝචනය කිරීමට පාර්ලිමේන්තු විමසුමක්ද අරඹනු ඇත. එම විමසුමට සියලුම පාර්ශ්වකරුවන් සම්බන්ධ වෙනු ඇති අතර තාක්ෂණිකව දියුණු, සහභාගීත්ව, තිරසර හා පාරිසරිකව ශක්‍ය ධීවර කර්මාන්තයක් තහවුරු කිරීමට සුදුසු ක්‍රියාමාර්ග නිර්දේශ කරනු ඇත. නීතිය ක්‍රියාත්මක කිරීම, නීතිය උල්ලංඝනය කරන්නන්ට අදාළ දඬුවම් මගින් තවත් ශක්තිමත් කෙරෙනු ඇත. මෙය සිදු කෙරෙනු ඇත්තේ නීතිය කඩකරන සාමාජිකයින්ට සුදුසු දඬුවම් පමුණුවන ධීවර සමුපකාර ශක්තිමත් කිරීමෙනි. මේ ආකාරයට අපි, වර්තමාන පරපුර සඳහා පමණක් නොව අනාගත පරපුර සඳහාද ශක්‍ය සහ පාරිසරිකව තිරසර ධීවර කර්මාන්තයක් තහවුරු කරන්නෙමු.

---

## 9.3 සත්ව සුබ සාධනය

අප බොහෝ දෙනෙක් සතුන්ට ආදරය කරන නමුත් ශ්‍රී ලංකාව තුළ සතුන්, ඔවුන් ගෘහ පරිභෝජනයට ඇති කරන්නවුන් හෝ සුරතල් සතුන් හෝ වේවා, අතිමහත් වධබන්ධනයන්ට නිරාවරණය වේ. එමෙන්ම, නිදැල්ලේ ගමන් කරන සතුන් සම්බන්ධව අනුගමනය කෙරෙන ප්‍රතිකාරයන්ද බොහෝ විට රුදුරු වෙයි. සතුන්ගේ සුබ සාධනය ආරක්ෂා කිරීමට ඇති නීති පද්ධතිය බොහෝ විට උල්ලංඝනය වේ. සත්ව ආරක්ෂාව සම්බන්ධ නීති පනවන්නන්, නිෂ්පාදකයන්ගේ සහ මහා පරිමාණ කෘෂිකාර්මික අභිලාශයන්ට පක්ෂපාතී වේ.

විද්‍යාත්මක පරීක්ෂණයන් සඳහාද අදාළ වන පරිදි සත්ව සුබ සාධන ප්‍රමිතීන් හා මාර්ගෝපදේශ ස්ථාපිත් කිරීමෙන් මෙම අයහපත් තත්වය වෙනස් කිරීමට අපි කටයුතු කරන්නෙමු. මීට අමතරව, පවත්නා නීතිරීති හා ඒවා ක්‍රියාත්මක කිරීම පිළිබඳ පුළුල් සමාවලෝචනයක් කිරීම සඳහා අපි සත්ව අයිතිවාසිකම් සහ සුභසාධනය පිළිබඳ කමිටුවක් (ARWC) ස්ථාපිත කරන්නෙමු. මෙම ක්‍රියාවලියේදී, පුළුල් ප්‍රජාවද ඇතුළත්ව, විවිධ පාර්ශ්වකරුවන්ගෙන් අදහස් විමසීමක් සිදු කෙරෙනු ඇත.

ARWC විසින් තම සොයාගැනීම්වලට අනුකූලව, විද්‍යාත්මක, කෘෂිකාර්මික, කාර්මික හෝ ගෘහස්ථ වේවා සත්ව සුබසාධනය හා සම්බන්ධ වර්තමාන නීති පද්ධතියේ ඇති අඩුලුහුඩුකම් නිරාකරණය කිරීම සඳහා නිර්දේශ මාලාවක් ඉදිරිපත් කරනු ඇත. පරිභෝජනය සඳහා සහ බිත්තර ලබාගැනීමට ඇති කරන කුකුළන් සහ කිකිළියන් මෙන්ම මස් මඩු තුළ ඝාතනය කෙරෙන සතුන් හට මානුෂිකව සැලකීම මෙම වාර්තාව මගින් ආවරණය වෙනු ඇත. මෙයට පසුව අනුකූලතාව අධීක්ෂණය කිරීම සඳහා අපි සත්ව අයිතිවාසිකම් සහ සුභසාධනය පිළිබඳ කමිටුවක් (ARWC) පිහිටුවනු ඇත. සතුන්ට මානුෂික ලෙස සලකන බව සහතික කිරීමට නීතිමය දඬුවම් සහ විධිවිධාන ලබාදී ඔවුන් ශක්තිමත් කෙරෙනු ඇත. මීට අමතරව, සත්ව සුභසාධන නීති ක්‍රියාත්මක කිරීම සඳහා සත්ව කෲරත්වය වැළැක්වීමේ අිකාරිය (ACPA)ක් ස්ථාපිත කිරීමට කටයුතු කරන්නෙමු.